අද්‍යතන තාක්ෂණික යුගයේ පාසල් සිසුන් අතර සමාජ මාධ්‍ය භාවිතය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇති අතර එය උසස් පෙළ සිසුන්ගේ ශිෂ්‍ය සාධනය කෙරෙහි ද විවිධාකාරයෙන් බලපෑම් ඇති කරන සාධකයක් බවට පත් වී ඇත. රත්නපුර අධ්‍යාපන කලාපය ආශ්‍රිත ව උසස් පෙළ සිසුන්ගේ සමාජ මාධ්‍ය භාවිතය සහ ශිෂ්‍ය සාධනය අතර පවතින සබඳතාව විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමත්, ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමට නව්‍ය ගෝලීය ප්‍රවණතාවලට සමඟාමී ව නවෝත්පාදන මුහුණුවරකින් සමාජ මාධ්‍ය වේදිකා සමාජගත කිරීමත් මෙම පර්යේෂණයෙහි ප්‍රධානත ම අරමුණු විය. වත්මන් සමාජයේ සිසුන් අතර සමාජ මාධ්‍ය වේදිකා පරිශීලනය ඉහළ යාමත් සමඟ ම ඔවුන්ගේ ශිෂ්‍ය සාධනය කෙරෙහි එමඟින් ඇති කරන ඍණාත්මක බලපෑම අධ්‍යාපනික ක්ෂේත්‍රයෙහි ප්‍රබල ගැටලුවක් ලෙස හඳුනාගෙන ඇත. මෙම ගැටලුව අධ්‍යයනය කිරීම සඳහා මිශ්‍ර ක්‍රම පර්යේෂණ ප්‍රවේශයක් යටතේ, ස්තරායන අහඹු නියැදිකරණයට අනුව තෝරාගත් උසස් පෙළ සිසුන් 400ක් සඳහා ව්‍යූහගත ප්‍රශ්නාවලියක් ලබා දී ප්‍රමාණාත්මක දත්ත රැස් කර ගත් අතර සාරම්මණ නියැදිකරණයට අනුව උසස් පෙළ සිසුන් 60ක් සහ උසස් පෙළ ගුරුවරුන් 40ක් ඇතුළත් නියැදියක් සඳහා විවෘත සම්මුඛ සාකච්ඡා පවත්වා ගුණාත්මක දත්ත රැස් කර ගන්නා ලදී. මේ අනුව රැස්කර ගත් දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යානය, යුගල සාම්පල 'ටී පරීක්ෂාව', පියර්සන් සහසම්බන්ධතා සංගුණක විශ්ලේෂණය, 'කයි - වර්ග' පරීක්ෂණ සහ 'නිගාමී තේමා පාදක විශ්ලේෂණය' යන ක්‍රමවේද භාවිත කරන ලදී. සමස්ත පර්යේෂණයේ ප්‍රතිඵල අනුව සමාජ මාධ්‍ය භාවිතය සඳහා දෛනිකව වැය කරන කාලය, භාවිත වාර ගණන සහ භාවිත වසර ගණන ශිෂ්‍ය සාධනය කෙරෙහි ශක්තිමත් ඍණාත්මක සහසම්බන්ධතාවක් පෙන්නුම් කරන බව තහවුරු විය. එමෙන් ම සමාජ මාධ්‍ය භාවිතයේ ඍණාත්මක බලපෑම් ලෙස සිසුන්ගේ ඉගෙනුම් අවධානය ගිලිහී යාම, කාල කළමනාකරණය ආශ්‍රිත ගැටලු, මානසික හා කායික සෞඛ්‍යමය ගැටලු, විනය හා සදාචාරාත්මක ගැටලු, අධ්‍යාපනික කටයුතුවලට දක්වන උනන්දුව අවම වීම, විවිධ ඇබ්බැහිවීම්වලට යොමු වීම සහ ශිෂ්‍ය සාධනය අවම වීම වැනි බලපෑම් හඳුනාගත හැකි විය. සමාජ මාධ්‍ය භාවිතයේ පවතින ධනාත්මක බලපෑම් ලෙස සිසුන්ට අධ්‍යාපනික සම්පත් හුවමාරු කර ගැනීමට, මාර්ගගත ඉගෙනීමට, මිතුරන් සමඟ අධ්‍යාපනික සාකච්ඡාවල නිරත වීමට, විවිධ අධ්‍යාපනික මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීමට, ගුරුවරුන් සමඟ අන්තර් සබඳතා පවත්වා ගැනීමට සහ අධ්‍යාපනික වශයෙන් වැදගත් වන වීඩියෝ දර්ශන නැරඹීමට අවස්ථා විවර වීම වැනි සාධක ද අනාවරණය විය. මේ අනුව සමාජ මාධ්‍ය භාවිතය ස්වභාවයෙන් ම අධ්‍යාපනික ක්‍රියාවලිය කෙරෙහි අහිතකර නො වන අතර එහි බලපෑම භාවිතයේ අරමුණු, දෛනික ව භාවිත කරන කාල පරාසය සහ ස්වයං පාලනය මත තීරණය වන බව සනාථ විය. මෙම ප්‍රතිඵලවලින් සමාජ මාධ්‍ය වේදිකා භාවිතය වාරණය කිරීම වෙනුවට එය ගෝලීයකරණ නවෝත්පාදන ප්‍රවේශ සමඟ සම්මිශ්‍රණය කරමින් අධ්‍යාපනික ඉගෙනුම් ඉගැන්වීමේ මෙවලමක් ලෙස ඵලදායී ව සහ සැලසුම්සහගත ව භාවිත කිරීමේ අවශ්‍යතාව යෝජනා කරනු ලබයි. මෙහි දී සිසුන්ගේ කාල කළමනාකරණය, ශිෂ්‍ය ස්වයං පාලනය, ගුරුවරුන්ගේ නිවැරදි මඟපෙන්වීම හා දෙමාපියන්ගේ නිසි අධීක්ෂණය ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය සාධක වන අතර අනාගත අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයේ දී සමස්ත ශිෂ්‍ය ප්‍රජාව කෙරෙහි ම ඩිජිටල් සාක්ෂරතාව සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ පුළුල් දැනුවත් කිරීමක අවශ්‍යතාව ද මෙම පර්යේෂණයෙන් නිර්දේශ කරනු ලබයි.

මුඛ්‍ය පද : *උසස් පෙළ සිසුන්, ශිෂ්‍ය සාධනය, සමාජ මාධ්‍ය භාවිතය, අධ්‍යාපනික බලපෑම්*

Investigating the Impact of Inquiry-Based Learning Methods in Biology Teaching on Students' Investigative and Critical Thinking Skills

Ranasinghe, M. N.
Faculty of Graduate Studies,
Eurasian Campus, Sri Lanka
menira93@gmail.com

Abstract

The effect of an inquiry-based learning (IBL) intervention on secondary-level biology students' critical thinking and investigative competencies within a Sri Lankan international-curriculum school, situating the enquiry within contemporary calls for sustainable, evidence-based pedagogical innovation were examined within the study. Employing a pragmatic, mixed-methods design comprising a one-group pretest–posttest structure supplemented by qualitative interviews and systematic classroom observation, the study engaged 120 Cambridge-curriculum students (Grades 8–10) and their biology teacher across a twelve-week period. The intervention progressed systematically from structured to guide to open inquiry, in accordance with established models of scaffolded skill acquisition. Critical thinking was assessed using an adapted 40-item Critical Thinking Assessment Tool ($\alpha = .82$), while investigative competence was measured through a six-dimension Investigative Skills Rubric ($\kappa = .78$); complementary data were derived from a weekly Student Engagement Observation Scale and semi-structured interviews with 24 students and the class teacher. Paired-samples t-tests revealed statistically significant improvements in critical thinking, $t(119) = 17.34$, $p < .001$, $d = 1.58$ (34% increase), and investigative skills, $p < .001$, $d = 1.60$ (28% increase), with the most pronounced gains observed in the data-analysis and hypothesis-formation subdomains. Engagement increased by 60% across the intervention period and emerged as the strongest predictor of critical-thinking improvement ($\beta = .45$, $R^2 = .64$). Thematic analysis identified five superordinate themes, including enhanced scientific reasoning, valued collaborative learning, and an unanticipated transfer of inquiry-oriented habits to non-science disciplines. Findings are discussed in relation to constructivist learning theory and their implications for curriculum innovation, teacher professional development, and educational sustainability within resource-constrained Sri Lankan secondary education. The study contributes empirical evidence supporting the integration of inquiry-based pedagogy as a sustainable mechanism for cultivating twenty-first-century competencies in developing-country educational contexts.

Keywords: *Inquiry-Based Learning, Biology Education, Critical Thinking, Investigative Skills, Sustainable Pedagogical Innovation*

මානසික අක්‍රමතා සඳහා මනෝප්‍රතිකාරයන්හි ඵලදායිතාවඃ මනෝඋපදේශකවරුන්ගේ හා මනෝචිකිත්සකවරුන්ගේ සේවා අත්දැකීම් හා ආකල්ප ඇසුරින් සිදුකෙරෙන මනෝවිද්‍යාත්මක අධ්‍යයනය

බණ්ඩාරනායක, බී. එම්. ටී. පී.
දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
tharushikapramodi2020@gmail.com

සාරසංක්ෂේපය

නූතනයේ දී පුද්ගලයින් බහුලව පීඩා විඳින මානසික අක්‍රමතා සඳහා උපයෝගි කරගනු ලබන මනෝ ප්‍රතිකාරයන් හි ඵලදායිතාවය විමර්ශනය කිරීමත් එවැනි මානසික අක්‍රමතා සුවකර ගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීමත් කාලීන අවශ්‍යතාවයකි. මෙම පර්යේෂණය පදනම් වී ඇත්තේ මානසික අක්‍රමතා සඳහා යොදාගනු ලබන මනෝප්‍රතිකාරයන් හි ඵලදායිතාවය මනෝඋපදේශකවරුන් හා මනෝචිකිත්සකවරුන්ගේ සේවා අත්දැකීම් හා ආකල්ප හරහා විමර්ශනය කිරීම යන ප්‍රධාන අරමුණ ඇතිව වේ. ඒ අනුව සායනික මනෝවිද්‍යාවේ ප්‍රගමනය මූලික කොටගෙන මානසික අක්‍රමතා සඳහා යොදා ගනු ලබන මනෝප්‍රතිකාරයන්හි ඵලදායිතාවය කෙබඳු ද යන ගැටලුව මත පදනම්ව මෙම පර්යේෂණයට අදාළ තොරතුරු විමර්ශනය කර ඇත. ඒ ඔස්සේ මනෝප්‍රතිකාර සාර්ථක කරගැනීම සඳහා වඩාත් සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම ද මෙමඟින් බලාපොරොත්තු වේ. මෙම පර්යේෂණය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ සේවය කරන මනෝචිකිත්සකවරුන් 5 දෙනෙකු හා මනෝඋපදේශකවරු 15 දෙනෙකු අරමුණුගත නියැදි ක්‍රමවේදය යටතේ තෝරාගෙන ඇත. මෙම පර්යේෂණය ප්‍රධාන වශයෙන් ගුණාත්මක දත්ත මත පදනම් වූ පර්යේෂණයක් වන අතර සම්මුඛ පර්යේෂණ ක්‍රමවේදය හරහා ප්‍රශ්නාවලි ක්‍රමවේදයක් ඔස්සේ තොරතුරු රැස් කිරීම සිදු කරන ලදි. එමඟින් ලබාගත් දත්ත තේමාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය හරහා විශ්ලේෂණය කොට ඇති අතර මෙම පර්යේෂණය මඟින් මනෝචිකිත්සකවරයා හෝ මනෝඋපදේශකවරයා විසින් සේවාලාභියාට අදාළ මනෝප්‍රතිකාරයන් සිදු කරන විට දී මුහුණ දෙන සාර්ථක හා අසාර්ථක තත්ත්වයන් විමර්ශනය කරනු ලබයි. තවදුරටත් මෙම පර්යේෂණය මඟින් මානසික අක්‍රමතා සඳහා යොදාගනු ලබන මනෝප්‍රතිකාර විධික්‍රම වර්ග පිළිබඳව ඳ විමර්ශනය කිරීමේ පසුබිම උදා විය. සමස්තයක් වශයෙන් පර්යේෂණය අවසානයේ තෝරාගත් මනෝචිකිත්සකවරුන් හා මනෝඋපදේශකවරුන් මානසික අක්‍රමතා සුව කිරීම සඳහා යොදාගනු ලබන මනෝප්‍රතිකාරයන්හි ඵලදායිතාවය කෙබඳු ද යන්න විමර්ශනය කළ හැකි විය. මෙම පර්යේෂණ තොරතුරු පදනම් කොටගෙන ඉදිරි පර්යේෂකවරුන් හට ද සායනික මනෝවිද්‍යාව සම්බන්ධ වූ නව සංකල්පයන් බිහි කළ හැකි අතර මෙමඟින් තවදුරටත් මානසික අක්‍රමතා හා මනෝප්‍රතිකාර පිලිබඳව අධ්‍යයනය කරන සායනික මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ සංවර්ධනය කෙරෙහි මහා රුකුලක් සපය යි.

මුඛ්‍ය පද : *මනෝඅක්‍රමතා, මනෝඋපදේශකයින්, මනෝචිකිත්සකවරු, මනෝප්‍රතිකාර, මනෝවිද්‍යාව*

Undergraduate Students' perceptions of Inclusive English Teaching Practices in Selected Higher Education Institutions in Colombo District, Sri Lanka

Abraham, E.
Faculty of Humanities and Social Sciences,
Eurasian Campus, Sri Lanka
enokaabraham2@gmail.com

Abstract

English language teaching for inclusive higher education has an increasing importance because undergraduate students enter the class room with different language proficiencies and learning styles, and different academic backgrounds are cultural experiences. Although the importance of inclusive pedagogy is increasingly acknowledged, there is not much empirical evidence related to the impact of inclusive pedagogy on student engagement in the Sri Lankan context in different types of institutions. The aim of this study was to investigate the perceptions of inclusive English teaching practices and the correlation with the behavioral, emotional, and cognitive engagement of the undergraduate students in the selected higher education institutions in Colombo District. Cognitive engagement of the undergraduate students in the selected higher education institutions in Colombo District, Sri Lanka. A qualitative and descriptive research was designed and used. The population obtained on undergraduate students who were studying English in selected private and conventional higher education institutions in the Colombo District and random sampling of 380 students was selected. The data collection instruments used were structured questionnaire with open-ended items that included questions relating to the students' experiences of equal participation, teaching approaches that way, learning materials that are accessible, good lecturer-student interaction, collaborative learning culturally responsible teaching and inclusive assessment. Responses were examined thematically to identify patterns of students' perceptions of inclusive practice and engagement make comparisons between the categories of institutions. The results indicated that there was a strong link between inclusive English teaching practices and student engagements that students who started they had more enriching experiences in an inclusive setting. The students were participated with interest in English learning, confident of their own language abilities. They concentrated they belonged, concentrated with full effort to learn English. The results depicted clear differences between institutional setting. The study results indicate that inclusive English teaching practices are important to achieve meaningful student engagement in higher education. The results provided implications for English language lecturers, University administration and curriculum developers who were interested in creating more four types of engagements were Behavioral, Emotional, Cognitive, Learning Diversity and class room participation.

Keywords: *Emotional , Behavioral , Cognitive, Classroom Participation, Inclusive Education*

An Exploration of Mindfulness and Its Role in Mental Well-Being

Meepegama, A. M. V.
Faculty of Graduate Studies,
Eurasian Campus, Sri Lanka
amvmeepegama@gmail.com

Abstract

Mindfulness has become a broadly discussed global topic and exploring the application of mindfulness practices will be an advantage for solving current problems and conflicts among individuals and the society. The research problem is to explore Buddhist mindfulness techniques for the development of individual mental wellbeing and impacts of mindfulness practices on social dynamics within a psychological context. The objective of this research is to partake in a qualitative approach to explore mindfulness and its role in general mental wellbeing examining its effectiveness and evaluating the impacts of mindfulness. A qualitative analysis of existing literature based on secondary data, is being executed through the research to explore mindful techniques and tools for human mental well-being. The study focused on the analysis of Satipaṭṭhāna Sutta as a core theoretical framework in conjunction with the neurobiology of the mindfulness practices. Contemporary mindfulness-based interventions significantly incorporate the basic principles of Satipaṭṭhāna Sutta, mainly sitting meditation, mindful walking and systematic body scanning out of its four major practices; contemplation of body, feelings, mind, and mental objects. The results found that the technological development and digitalization expanded the applications of mindfulness by means of Artificial Intelligence and Virtual Reality, introducing simplified forms of traditional methods of mindfulness to a more adaptable and accessible practice for hectic lifestyles. The outcomes of the study show that the application of scientific and psychological mechanisms, enlightened by Buddhist concepts, against different population groups highlights the transition of the concept of mindfulness from holistic and spiritual philosophy to a clinical tool that helps coping mental distress and discomfort. Exploration of main concepts, core principles, psychometrics and benefits of mindfulness brought significant value for the study and made implications for the nourishment of future aspects.

Keywords: *Mindfulness, Mental Wellbeing, Stress Reduction, Mindfulness-Based Interventions, Buddhist Techniques*

The Role of Phonics Instructions in Early English Literacy Development

Senadheera, N. K. U. S.
Department of Education Science,
Faculty of Humanities and Social Sciences,
Eurasian Campus, Sri Lanka
nkussenadeera@gmail.com

Abstract

Early Literacy development provides critical foundation for children's future academic achievement, and effective approaches to developing English literacy are particularly important for learners with limited exposure to English outside the classroom. This qualitative study explores the role of phonics instructions in early English literacy development among primary school learners in the Nuwara Eliya district of Sri Lanka. The study aims to examine teacher's understanding and classroom practices related to phonics, their perception of learners' outcomes, the challengers encountered in implementation, and their professional support needs. Semi- structured interviews were conducted with twelve English and primary literacy teachers representing eight government, private and international schools. Thematic analysis was employed to identify key patterns and themes emerging from the participants' experience and perspectives. The findings indicate the teachers perceive phonics as an important foundation for developing learners' decoding, pronunciation, spelling and reading confidence. This was considered particularly beneficial for children who have limited opportunities to use English beyond the school environment. However, the implementation of phonics varied across educational settings. Teachers in better resourced school reported using structured phonics programs, whereas other relied on teacher–developed resources and integrated phonics activities into boarder English lessons. Major challengers included limited specialist training, inadequate and uneven availability of teaching materials, large class sizes, curriculum pressures and the absence of common assessment tools. The study concludes that systematic phonics instruction can strengthen early literacy development when intergraded with oral language, meaningful reading, vocabulary, writing and comprehension. It recommends sustained professional development, clearer curriculum guidance, formative assessment practices and equitable access to low- cost phonics resources to support effective implementation in Sri Lankan primary schools.

Keywords: *Decoding, Pronunciation, Spelling, Teacher Perceptions, Primary Learners*

From Vedanā to Compassion and Care: An Early Buddhist Perspective on Psychological Distress Associated with Premenstrual Syndrome

Kameshi, W. M.
Faculty of Buddhist Studies,
Nagananda International Institute for Buddhist Studies, Sri Lanka
Manudulakameshivoice@gmail.com

Abstract

Premenstrual Syndrome (PMS) refers to a number of physiological, psychological, and emotional experiences experienced by women before menstruation occurs during their menstrual cycle. Experiences like irritability, anxiety, mood disturbances, cravings, fatigue, and other physical symptoms may interfere with women's everyday activities. Contemporary methods of treating/preventing/preparing for PMS include psychoeducation, lifestyle changes, stress management techniques, psychological techniques, such as, Cognitive Behavioral Therapy (CBT)), and mindfulness-based interventions. Although all the above methods are widely studied within multidisciplinary women's health research field, the contribution of Buddhist philosophy to this topic is also worth exploring. This study focuses on Buddhist teaching about feeling (*Vedanā)*, and its association with teachings about mindfulness, non-aversion, compassion, and equanimity as described in some early Buddhist literature. Using qualitative textual analysis and comparative analysis, this research looks into the way in which early Buddhist teachings perceive unpleasant feeling and the reaction to it. Finally, this paper discusses the Buddhist views on unpleasant feeling and compares them with current non-pharmacological views on PMS-related psychological suffering. It should be noted that the research does not intend to make a diagnosis of PMS or PMDD, investigate treatment options or imply that Buddhist methods may act as an alternative to medicine and psychotherapy. Instead, the objective of the study is to uncover intersections of concepts between the early Buddhist concept of feeling and methods used today to deal with premenstrual distress. Specifically, the research will focus on the process of developing compassion when dealing with suffering starting from awareness of vedanā. In addition, it will explore the potential of this knowledge for compassionate spiritual care of women with premenstrual distress from the perspective of Buddhist studies.

Keywords: *Premenstrual Syndrome (PMS), Mindfulness, Compassionate Care, Spiritual Care, Women's Health*

Painting as the Multi-Sensory Art Intervention for Psychological Resilience in the Inclusive Classroom of Slow Learners

Gunasekara, U. V. S. S.
Department of Fine Arts,
University of Peradeniya
gunasekarasanduni80@gmail.com

Abstract

In contemporary educational therapy, inclusive education and psychological well-being are critical components of sustainable human development. Traditional educational models often rely on rigid cognitive and verbal techniques that are difficult to engage with slow learners and children with learning difficulties. The study investigates to bridge expression of painting as a non-verbal tool between psychological resilience of slow learners to promote inclusiveness in their classroom. Under the research problem the study specifically examines how painting and multisensory art interventions can act as therapeutic tools for emotional regulation, motor skill development, and sustained attention. Using a qualitative research methodology based on field-based art therapy work, this research analyzes structured expressive activities conducted with slow learners, specifically nature-inspired murals and direct-touch finger painting techniques. The sample consisted of thirty students (N=30) from the age ten to fifteen at Harangala Secondary school, Kothmale in the Central Province. The artistic activities that the children did by moving their hands and feet and touching materials were a great help in relieving their mental stress without using words and in controlling their senses. Although the students, who are basically slow learners, have difficulty maintaining attention for long periods of time, they were able to complete their artistic creations with great interest and mental satisfaction through the combination of colors and tactile media. In addition to the individual psychological relief this provides, this research highlights the importance of incorporating such sensory-based art activities into inclusive classroom. Finally, painting is not just an aesthetic endeavor, but an innovative and sustainable educational tool that develops the mental strength, attention, and sociability of the students with slow learners.

Keywords: *Multi-Sensory Art Intervention, Psychological Resilience, Inclusive Classroom, Slow Learners, Art Therapy, Expressive Activities, Emotional Regulation*

Investigating School Distress, Interpersonal Conflicts, and Confidential Mental Support for Sri Lankan School Children

Delpitiya, N. Y.[1*], Priyankara, M. M. K. [2], Morahellage, M. N. M.[3]
[1, 2, 3] Independent Researcher
* nisa83yd2005@gmail.com

Abstract

Teenage students in Sri Lanka experience considerable stress and psychological discomfort as a result of an education system that prioritizes high-stakes national tests over creativity and innovation. This tremendous academic pressure encourages peer rivalry, interpersonal problems, and widespread bullying. Beyond intellectual rivalry, these tensions are typically exacerbated by social variables such as peer approval and sexual attraction. A mixed-methods case study was conducted using structured questionnaires and interviews to investigate the prevalence, causes, and nature of these issues, as well as students' coping mechanisms and systemic barriers. A confidential digital reporting tool was also tested to maintain anonymous reporting mechanisms. The study examined the roles of school leadership, parents, and cultural factors in student well-being in order to develop meaningful support recommendations. The data show that bullying and severe peer conflict cause school avoidance and absence. Importantly, victims seldom disclose these incidents to parents or school administration because to a lack of confidence in administrative help. Furthermore, problems over romantic interests or gender dynamics cause significant guilt, prohibiting youth from communicating openly with authoritative officials, keeping most concerns secret and unaddressed. Deeply ingrained Sri Lankan cultural conventions create considerable communication hurdles between pupils, teachers, and parents, aggravating internal suffering. The study indicates that youth urgently deserve accessible, professional mental health care in secure, compassionate, and welcoming surroundings. Additionally, a peer-counseling structure can be introduced. To bridge current communication barriers, mental health treatments must be practical, dependable, and totally confidential in order to respect privacy and effectively encourage help-seeking behavior among Sri Lankan adolescents.

Keywords: *Teenage Mental Health, Peer Conflict, Bullying, Help-Seeking Barriers, Student-Parent Communication*

පූර්ව ළමාවිය දරුවන්ගේ බුද්ධි වර්ධනය කෙරෙහි පෝෂණයේ බලපෑම් පිළිබඳ අධ්‍යයනයක්

සිෆානියා, එම්. ආර්. එෆ්.
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
යුරේසියානු සරසවිය, ශ්‍රී ලංකාව
Sifafathima51@gmail.com

සාරසංක්ෂේපය

පූර්ව ළමාවිය යනු දරුවෙකුගේ ශාරීරික, මානසික, සමාජීය මෙන් ම ප්‍රජානන සංවර්ධනය සඳහා වඩාත් වැදගත් කාලපරිච්ඡේදයකි. මෙම අවධියේ දී දරුවෙකු ලබන පෝෂණීය උත්තේජනය ඔවුන්ගේ බුද්ධි වර්ධනය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරනු ලබයි. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් සිරිබෝපුර වසමේ පූර්ව ළමාවිය දරුවන්ගේ පෝෂණ මට්ටම සහ ඔවුන්ගේ බුද්ධි වර්ධනය අතර පවතින සහසම්බන්ධතාවය විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීම යි. මිශ්‍ර ක්‍රමවේදයක් යටතේ ඉලක්කගත ජනගහනය ලෙස සිරිබෝපුර වසමේ පෙරපාසලක අධ්‍යාපනය ලබන අවුරුදු හතර පහ අතර වයස් කාණ්ඩයට අයත් දරුවන් 50 දෙනෙකුගෙන් (N = 50) සමන්විත ප්‍රධාන නියැදියක් සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මගින් දරුවන්ගේ වයස, ස්ත්‍රී / පුරුෂ භාවය, මවගේ අධ්‍යාපනය, පවුලේ මාසික ආදායම සහ පෝෂණ රටාව පිළිබඳ දත්ත රැස් කරන ලදී. දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඇගයීම සඳහා ශරීර ස්කන්ධ දර්ශකය (BMI - Body Mass Index) භාවිතා කරන ලදී. මෙම අරමුණු ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා ඉලක්කගත ජනගහනයෙන් සරල අහඹු නියැදි ක්‍රමවේදයෙන් (Simple Random Sampling) තෝරාගත් දරුවන් 20 දෙනකුගෙන් (n = 20) උප නියැදියක් භාවිතා කරමින් ප්‍රමාණාත්මක දත්ත සඳහා ලිකර්ට් පරිමාණය (Likert Scale) මත පදනම් වූ බුද්ධි වර්ධන ඇගයීම් පරීක්ෂණ ලකුණු රැස් කරන ලද අතර පන්ති කාමර නිරීක්ෂණය මගින් එම දත්ත නිවැරදිභාවය තහවුරු කරගන්නා ලදී. එමෙන් ම ගුණාත්මක දත්ත රැස් කිරීම සඳහා ගුරුවරුන් සමග අර්ධ - ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ජන විකාශන දත්ත අනුව දරුවන්ගෙන් 88% සාමාන්‍ය බරෙන් යුක්ත වූ අතර 8%ක් මධ්‍යස්ථ මන්දපෝෂණයෙන් පෙළෙන බවත් පවුල් වලින් අඩකට ආසන්න ප්‍රමාණයක මාසික ආදායම රුපියල් 35000 ට අඩු වූ අතර මව්වරුන්ගෙන් 90% ඉහළ සාක්ෂරතාවයක් පැවති බවට හඳුනාගෙන ඇත. තවද දරුවන්ගෙන් 84% ප්‍රශස්ත දෛනික පෝෂණ රටාවක් අනුගමනය කරන බව ද අනාවරණය විය. ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යානය හා ප්‍රතිපායන විශ්ලේෂණය මගින් විශ්ලේෂණය කර පෝෂණ මට්ටම් සහ බුද්ධි වර්ධනය අතර පවතින සම්බන්ධතාවය හඳුනාගන්නා ලදී. අධ්‍යයන ප්‍රතිඵල අනුව $r = 0.8997$ / $r = 0.9000$, $F = 75.839$, $P < 0.0001$ මගින් තහවුරු වූයේ පෝෂණයේ ගුණාත්මකභාවය ඉහළ යන විට දරුවන්ගේ බුද්ධිමය ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස ඉහළ යන බවත් පෝෂණ මට්ටම් සහ බුද්ධි වර්ධනය අතර ඉතා ප්‍රබල ධන සම්බන්ධතාවයක් සහ විචලනයෙන් 80.94%, 81.0% සංඛ්‍යානමය වශයෙන් අනාවරණය විය. ගුණාත්මක දත්ත විශ්ලේෂණ මඟින් දරුවෙකුගේ දෛනික සමබල ආහාර වේල, ක්‍රියාශීලි බව, මතක ශක්තිය, නිර්මාණශීලීත්වය, සමාජ අන්තර් ක්‍රියාව සහ පන්ති කාමර අවධානය රඳවා ගැනීමේ හැකියාව අතර පැහැදිලි මනා සම්බන්ධතාව පවතින බව සනාථ විය. මෙම සොයාගැනීම් මත පදනම්ව පූර්ව ළමාවිය දරුවන්ගේ බුද්ධි වර්ධනය උදෙසා නිසි පෝෂණ කළමනාකරණය අත්‍යවශ්‍යය සාධක අතර මුල් ළමාවියේ සිට ම දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ මට්ටම් ඉහළ නැංවීම සඳහා වූ විධිමත් ප්‍රතිපත්තිමය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ.

මුඛ්‍ය පද: *පූර්ව ළමාවිය, පෝෂණ මට්ටම, බුද්ධි වර්ධනය, සමාජ ආර්ථික සාධක, පියර්සන් සහසම්බන්ධතා*

Strategies for Transforming Fear into Participation in General English in use among Undergraduates at the University of Sri Jayewardenepura

Vithanage, U. S. P.
Department of English Language and Teaching,
University of Sri Jayewardenepura, Sri Lanka
svithanage@gmail.com

Abstract

General English in use, a compulsory subject offered to Arts Faculty undergraduates in Sri Lankan government universities, has consistently been marked by low participation and high levels of language anxiety. Rooted in exam-oriented schooling and sociocultural perceptions of English as a symbol of elitism, students often enter higher education with entrenched fear of English learning. This study was conducted to systematically examine strategies that could reduce anxiety and foster active engagement in General English classrooms, thereby addressing one of the most pressing challenges in English language teaching at the tertiary level. A mixed-methods design was employed to ensure methodological rigor. Quantitative data were collected through structured surveys administered to 115 Arts Faculty undergraduates, while qualitative insights were obtained from classroom observations and semi-structured interviews with six Department of English Language and Teaching (DELT) lecturers. Action research cycles were systematically employed to design, implement, observe, and refine pedagogical interventions. In each cycle, specific strategies, such as gamification, peer mentoring, localized content integration, and supportive feedback practices were introduced, monitored, and evaluated. Data from classroom participation records, student reflections, and lecturer feedback were analyzed after each cycle, ensuring continuous improvement and measurable impact. Findings revealed that student reluctance was not solely due to linguistic limitations but also linked to institutional gaps in remedial support and lecturer feedback styles. The interventions produced significant improvements in classroom participation, confidence, and willingness to use English in academic contexts. Gamified activities and peer mentoring emerged as particularly effective in reducing anxiety, while localized content helped students connect English learning to their cultural and social realities. The study concludes that overcoming language learning stress requires a deliberate shift toward empathetic, student-centered pedagogy. Its implications extend to curriculum design, lecturer training, and policy development, offering practical solutions to enhance English language learning in compulsory university courses.

Keywords: *Language Anxiety, Student Engagement, Pedagogical Interventions, Higher Education, Curriculum Innovation*

A Comparative Study of Differences Between the Pronunciation of Sri Lankan English and Modern Received Pronunciation

Gunawardana, P. Y. M.
Faculty of Graduate Studies,
Eurasian Campus, Sri Lanka
yomalig94@gmail.com

Abstract

Sri Lankans are more familiar with Received Pronunciation (RP), which was introduced during the colonial period. The English language constantly changes. Therefore, the English pronunciation of Sri Lankan English differs from MRP. This may be due to the influence of their mother tongue and a lack of awareness of the developments of the English language. Although Sri Lankan students study English for many years, many experience difficulties communicating in the international context. They may struggle to understand pronunciation patterns, and sometimes they may miscommunicate due to misunderstanding of native pronunciation. This research revealed pronunciation differences such as long vowels, stress placement, and connected speech between Sri Lankan English and MRP. The main objective of this study is to analyze the pronunciation differences between Sri Lankan English and MRP. This study contributes to the field of TESOL by providing a detailed comparison between Sri Lankan English and MRP, including segmental and suprasegmental features. This study adopted a qualitative method. The study focused on the pronunciation of Sri Lankan ESL learners in the Ja-Ela area. The interviews were conducted virtually or in-person which lasted 10 to 20 minutes. Participants were between 18 and 25 years old, including school students, school leavers, and university students. The Great Vowel Shift occurred over about 200 years. This awareness is limited to English teachers, linguistics students, and advanced learners. It is important for English teachers to remain updated on contemporary pronunciation patterns so that learners can be exposed to current pronunciation standards and develop more effective spoken communication skills. While the pronunciation features of Sri Lanka are widely accepted and understood within the local context, differences from internationally recognized pronunciation standards may occasionally affect cross-cultural communication. The findings revealed that guided pronunciation practice and exposure to authentic English enabled to improve their pronunciation, showing the importance of teaching pronunciation and spoken English in Sri Lanka. While first language influence is unavoidable, this research emphasizes that learners can gradually minimize recurring pronunciation errors through awareness and practice. The study supports learners' academic success, especially when they pursue higher studies in a strong native pronunciation environment.

Keywords: *Sri Lankan English, Modern Received Pronunciation (MRP), English Pronunciation, Segmental and Suprasegmental Features, Mother Tongue Influences*

ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේද මඟින් සිසුන්ගේ දශම සංඛ්‍යා එකතු කිරීම සහ අඩු කිරීම පිළිබඳ කුසලතා වර්ධනය කිරීම (තෝරාගත් පාසලක හය ශ්‍රේණියේ සිසුන් ඇසුරින්)

සත්සර, ඩබ්. ඒ. කේ.
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
යුරේසියානු සරසවිය, ශ්‍රී ලංකාව
wakumudusathsara@gmail.com

සාරසංක්ෂේපය

ගණිත අධ්‍යාපනයේ දශම සංඛ්‍යා පිළිබඳ නිවැරදි සංකල්පීය අවබෝධයක් ගොඩනැගීම ඉදිරි ගණිත ඉගෙනුම සඳහා වැදගත් පදනමක් වේ. එහෙත්, හය ශ්‍රේණියේ සිසුන් අතර දශම ස්ථානීය අගය හඳුනා ගැනීම, දශම ලක්ෂ්‍යය නිවැරදිව පෙළගැස්වීම සහ දශම සංඛ්‍යා එකතු කිරීම හා අඩු කිරීම සම්බන්ධයෙන් දුෂ්කරතා පවතින බව මූලික නිරීක්ෂණවල දී හඳුනා ගන්නා ලදී. එබැවින් ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේදයක් භාවිතයෙන් මෙම කුසලතා වර්ධනය කිරීම සහ ගණිතය පිළිබඳ සිසුන්ගේ ආකල්පවල වෙනස විමර්ශනය කිරීම මෙම ක්‍රියාමූලික පර්යේෂණයේ අරමුණ විය. තෝරා ගත් පාසලේ හය ශ්‍රේණියේ සිසුන් 26 දෙනෙකු නියැදිය ලෙස යොදා ගනිමින් 2026 මාර්තු සිට ජුනි දක්වා අධ්‍යයනය සිදු කරන ලදී. "පුංචි වෙළඳසැල" සහ "ආදර්ශ වෙළඳපොළ" වැනි ජීවිතයට සමීප ක්‍රියාකාරකම් මඟින් රුපියල් හා ශත භාවිත කර දශම සංඛ්‍යා එකතු කිරීම සහ අඩු කිරීම පුහුණු කරන ලදී. දත්ත රැස් කිරීම සඳහා පූර්ව හා පශ්චාත් පරීක්ෂණ, සහභාගීත් ව නිරීක්ෂණ, වැඩපත්‍රිකා විශ්ලේෂණය සහ විෂය භාර ගුරුවරුන් සමඟ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදී. ප්‍රමාණාත්මක දත්ත වගු හා ප්‍රතිශත මඟින් සංසන්දනාත්මක ව විශ්ලේෂණය කළ අතර ගුණාත්මක දත්ත තේමාත්මක ව අර්ථකථනය කරන ලදී. ප්‍රතිඵල අනුව දශම සංඛ්‍යා එකතු කිරීමේ සාමාන්‍ය සාධන මට්ටම 42% සිට 78% දක්වාත්, අඩු කිරීමේ සාධන මට්ටම 38% සිට 75% දක්වාත් ඉහළ ගොස් තිබුණි. සමස්ත නිපුණතා මට්ටම 40% සිට 76.5% දක්වා ඉහළ ගිය අතර, එය ප්‍රතිශත ලක්ෂ්‍යය 36.5 ක වැඩිවීමකි. තව ද සිසුන්ගෙන් 90%ක් ගණිතය පෙරට වඩා පහසු හා විනෝදජනක වූ බව ප්‍රකාශ කළ අතර, දශම ලක්ෂ්‍යය පෙළගැස්වීමේ වැරදි, ගණිත භීතිය සහ අවිශ්වාසය අඩු වී, සහයෝගී ඉගෙනුම, ක්‍රියාකාරී සහභාගිත්වය සහ ආත්ම විශ්වාසය වර්ධනය වූ බව නිරීක්ෂණය විය. මෙම සොයාගැනීම් අනුව ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම දශම සංඛ්‍යා පිළිබඳ සංකල්පීය අවබෝධය සහ ගණිතමය කුසලතා වර්ධනය කිරීමට ඵලදායී ප්‍රවේශයක් බව නිගමනය කළ හැකි අතර, හය ශ්‍රේණියේ දශම සංඛ්‍යා ඉගැන්වීමේ දී ශිෂ්‍ය කේන්ද්‍රීය සහයෝගී සහ ජීවිත අත්දැකීම් හා සම්බන්ධ ක්‍රියාකාරකම් වැඩි වශයෙන් භාවිත කිරීම නිර්දේශ කෙරේ.

මුඛ්‍ය පද: *ස්ථානීය අගය, ගණිත භීතිය, සහයෝගී ඉගෙනුම, ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශය, ක්‍රියාමූලික පර්යේෂණ*

The Role of Parental Involvement in Children's Oral Health-Related Learning and Behavior: A Study among Preschool Children in the Homagama Divisional Secretariat Area

Lahiruni, T. A. D. C.
Dental Therapist Training School,
Maharagama, Sri Lanka
lahirunichamindika@gmail.com

Abstract

Parents shape a child's earliest habits around brushing, diet, and dental visits. How much Sri Lankan preschool families actually know, feel, and do about these stays poorly documented, though. Early childhood caries prevalence remains high despite years of school-based oral health education. It is not clear whether the gap traces back to weak parental knowledge, an unfavorable attitude, or simply inconsistent practice at home. This study set out to measure parental Knowledge, Attitude, and Practice, KAP for short, and to test how these three domains relate to each other within the Homagama Divisional Secretariat area. A quantitative, descriptive cross-sectional design underpinned the work. Fifty parent-child pairs, children aged three to five, were drawn through multi-stage sampling across registered preschools. Data came from a structured questionnaire, and descriptive statistics plus Pearson correlation handled the analysis. Written informed consent was obtained from parents prior to data collection. All three domains landed in a moderate range: 71.0% for Knowledge, 69.6% for Attitude, 69.8% for Practice. Knowledge came out strongest, with half the sample rated Good, while Attitude and Practice clustered heavily in Moderate territory. None of the three domain pairs showed a statistically significant correlation, a pattern that fits Bandura's Social Cognitive Theory. Self-efficacy and reinforcement, not raw knowledge, appear to be what drives consistent practice here. Improving what parents know cannot be assumed to lift their attitude or practice automatically. Oral health programmes would do better shifting toward practice-oriented, family-inclusive work that builds parental self-efficacy through guided, hands-on engagement rather than more information alone. Larger, gender-balanced samples, triangulated practice measures, and longitudinal designs would help future work test whether targeted intervention actually shifts these moderate KAP levels over time.

Keywords: *Knowledge–Attitude - Practice (KAP) Framework, Early Childhood Caries, Social Cognitive Theory, Self - Efficacy, Family - Centred Health Promotion*

පාසල් දරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයට බලපාන මනෝවිද්‍යාත්මක සාධක හා ළමා හිමිකම් උල්ලංඝනය අතර සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනයක්

ඉන්ද්‍රජිත්, ඩබ්ලිව්. ඒ. ඒ. එස්.
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
යුරේසියානු සරසවිය, ශ්‍රී ලංකාව
waasindrajith@gmail.com

සාරසංක්ෂේපය

මෙම පර්යේෂණය පාසල් ළමුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹවීමට බලපාන මනෝවිද්‍යාත්මක සාධක සහ එහි ප්‍රතිඵලයක් ලෙස ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම අතර සම්බන්ධතාවය පරීක්ෂා කරයි. මෙම අධ්‍යයනය බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් අධ්‍යාපන කලාපයක පිහිටා ඇති අතර, නාගරික පාසල් ප්‍රජාවන්, මනෝ සමාජීය ආතතියට, සම වයසේ මිතුරන්ගේ ජාලවලට, වාණිජකරණය වූ ද්‍රව්‍ය පරිසරයන්ට සහ අසමාන ළමා ආරක්ෂණ ධාරිතාවට වැඩි වැඩියෙන් නිරාවරණය වන බැවින් මෙම පසුබිම තෝරාගෙන ඇත. ප්‍රධාන අරමුණ වන්නේ පාසල් දරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට බලපාන මනෝවිද්‍යාත්මක සාධක සහ එහි ප්‍රතිඵලයක් ලෙස ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම අතර සහසම්බන්ධය අධ්‍යයනය කිරීම යි. නිශ්චිත අරමුණු වන්නේ මත්ද්‍රව්‍ය භාවිතා කිරීමට ළමුන් පෙළඹවීමට බලපාන ප්‍රධාන මනෝවිද්‍යාත්මක සාධක, විශේෂයෙන් ආතතිය, කුතුහලය සහ තනිකම හඳුනා ගැනීමයි. මත්ද්‍රව්‍ය මත යැපීමෙන් පීඩාවට පත් දරුවන් මුහුණ දෙන ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ ස්වභාවය විමර්ශනය කිරීම, පවුල සහ පාසල් පරිසරය තුළ ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැතිකම මත්ද්‍රව්‍ය භාවිතය සඳහා දිරිගැන්වීමක් ලෙස ක්‍රියා කරන්නේ කෙසේදැයි පරීක්ෂා කිරීම, සහ තත්වය පාලනය කිරීම සඳහා මනෝවිද්‍යාත්මක සහ නීතිමය යෝජනා ඉදිරිපත් කිරීම. මිශ්‍ර ක්‍රම සැලැස්මක් අනුගමනය කරනු ලැබේ. පාසල් පහක වයස අවුරුදු 14 - 19 අතර සිසුන් 100 දෙනෙකුට ස්ථරීකෘත අහඹු සාම්පල භාවිතා කරමින් පරිපාලනය කරන ලද ව්‍යුහගත ශිෂ්‍ය ප්‍රශ්නාවලියක් හරහා ප්‍රමාණාත්මක දත්ත ජනනය කරනු ලබන අතර, පාසල් උපදේශකයින් සහ ළමා ආරක්ෂණ හෝ මනෝ සමාජීය සහාය විශේෂඥයින් ඇතුළු ප්‍රධාන තොරතුරු සපයන්නන් 10 දෙනෙකුගෙන් ගුණාත්මක සාක්ෂි රැස් කරනු ලැබේ. විශ්ලේෂණය විස්තරාත්මක සංඛ්‍යාලේඛන, විශ්වසනීයත්වය පරීක්ෂා කිරීම, සහ සම්බන්ධතා විශ්ලේෂණය, ප්‍රතිගාමී ආකෘති නිර්මාණය සහ තේමාත්මක අර්ථ නිරූපණය භාවිතා කරයි. ආකෘති ප්‍රතිඵලවලින් පෙන්නුම් කරන්නේ ආතතිය, කුතුහලය, තනිකම සහ සම වයසේ මිතුරන්ගේ බලපෑම මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹවීම සමඟ ධනාත්මකව සම්බන්ධ වී ඇති බවයි. මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹවීම පාසල් සම්බන්ධතාවයෙන් ඉවත් කිරීම, අපකීර්තියට පත් කිරීම, සෞඛ්‍ය නොසලකා හැරීම, අනාරක්ෂිත සම වයසේ මිතුරන්ගේ ජාලවලට නිරාවරණය වීම සහ උපදේශනය හෝ ආරක්ෂාව සඳහා ප්‍රවේශය අඩු කිරීම වැනි අයිතිවාසිකම් උල්ලංඝනයන්ට නිරාවරණය වීම සමඟ ද ධනාත්මකව සම්බන්ධ වේ. මත්ද්‍රව්‍ය ආශ්‍රිත අවදානමෙන් පීඩාවට පත් වූ දරුවන් ආරක්ෂාව, පුනරුත්ථාපනය, රහස්‍යභාවය සහ මනෝවිද්‍යාත්මක සහාය අවශ්‍ය අයිතිවාසිකම් දරන්නන් ලෙස නොව විනය වැරදිකරුවන් ලෙස නිතර සලකනු ලබන බව පෙන්වීමෙන් ගුණාත්මක සොයාගැනීම් ප්‍රමාණාත්මක ප්‍රතිඵලවලට සහාය වේ. පාසල් පාදක මත්ද්‍රව්‍ය වැළැක්වීමේ ප්‍රතිපත්තිය දඬුවම්වලින් ඔබ්බට ගොස් මුල් පරීක්ෂාව, රහසිගත උපදේශනය, පවුල් ශක්තිමත් කිරීම, ගුරු පුහුණුව, යොමු කිරීමේ මාර්ග සහ අපකීර්තියට පත් නො වන නීතිමය ආරක්ෂාව ඇතුළත් ඒකාබද්ධ ළමා අයිතිවාසිකම් සහ මානසික සෞඛ්‍ය රාමුවක් අනුගමනය කළ යුතු බව අධ්‍යයනයෙන් නිගමනය කෙරේ.

මුඛ්‍ය පද: *පාසල් දරුවන්, මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹවීම, මානසික සාධක, ළමා අයිතිවාසිකම්, ආතතිය, කුතුහලය, තනිකම, ශ්‍රී ලංකාව*

විදේශගත වූ දෙමාපියන්ගේ දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්

ප්‍රසාදිකා, බී. එම්. එස්.
තාක්ෂණ පීඨය,
යුරේසියානු සරසවිය, ශ්‍රී ලංකාව
sanduniprasadika69@gmail.com

සාරසංක්ෂේපය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන සාමාජීය ආයතනයක් වන 'පවුල' නම් වූ සංකල්පය පුද්ගල සංවර්ධනය කෙරෙහි වැඩි වශයෙන් බලපානු ලබයි. ඒ අනුව දෙමාපියන්ගේ රැකවරණය, ආදරය, ආරක්ෂාව, දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය යනා දී කරුණු මත එකී පුද්ගල සංවර්ධනය ඇතිවීමට පිටුවහලක් වන බව කිව යුතුය. නමුත් දෙමාපියන්ගේ විදේශගත වීම හේතුවෙන් දරුවන් හට සිය මව හෝ පියා, නැතිනම් දෙදෙනා ම තමා සමග නොා සිටීම හේතුවෙන් ඉහත දී සඳහන් කළ පරිද්දෙන් ඔවුන් විවිධ වූ අර්බුධකාරීමය තත්ත්වයන් හට මුහුණපාන බවත් සමාජය තුළ එය සමාජ ගැටළුවක් ව පවතින බවත් කිව යුතු ව ඇත. ඒ අනුව විදේශගත වූ දෙමාපියන්ගේ දරුවන්ගේ අධ්‍යාපනික තත්ත්වය කුමන ආකාරයක පවතින්නේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව යි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වශයෙන් වර්තමානයේ විදේශගත වූ දෙමාපියන් සිටින දරුවන්ගේ අධ්‍යාපනික තත්ත්වය පිළිබඳව අධ්‍යනය කිරීම සඳහන් කළ හැකි අතර සෙසු අරමුණු වශයෙන් විදේශගත වූ දෙමාපියන් සිටින දරුවන්ගේ අධ්‍යාපනයට පවතින දුෂ්කරතා කවරේ ද යන්න සොයා බැලීම, මනෝ සමාජීය බලපෑම, ඔවුන්ගේ අධ්‍යාපනයට පවුලෙන් ලැබෙන පිටුවහල පිළිබඳව අධ්‍යනය කිරීම, ඔවුන්ගේ අධ්‍යාපනයට පාසලෙන් ලැබෙන පිටුවහල පිළිබඳව අධ්‍යනය කිරීම, විදේශගත වූ දෙමාපියන් සිටින දරුවන්ගේ අධ්‍යාපන සුරක්ෂිතභාවය, ළමා සංවර්ධනය ඇති කිරීමට ජාතික වශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම යන අරමුණු දැක්විය හැකි ය. මෙම පර්යේෂණය විස්තරාත්මක පර්යේෂණයක් වන අතර අධ්‍යයන ප්‍රදේශ වශයෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ මහකුඹුක්කඩවල ප්‍රා. ලේ. කො. අයත් 614/A, කිවුල, අංක 04, කොට්ටුකච්චිය ග්‍රාමසේවා වසම තෝරා ගන්නා ලදී. නියැදිය සඳහා දරුවන්ගේ මව/ පියා/භාරකරුවන්ගෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමය ඔස්සේ ද, දරුවන්ගේ ගුරුභවතුන්ගෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමය ඔස්සේ දත්ත රැස්කර ගත් අතර දත්ත විශ්ලේෂණය සඳහා Microsoft Excel යන මෘදුකාංගය භාවිත කරන ලදි. විදේශගත දෙමාපියන්ගේ දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය සඳහා විවිධ වූ හේතුසාධක බලපෑම් කරන බව සඳහන් කල හැකිය. ඒ අනුව එකී සාධක හරහා එම දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වයට ධනාත්මක හෝ සෘණාත්මක බලපෑම් සිදුකරන අතර එම බලපෑම මත දරුවන්ගේ හැසිරීම් රටා වන, පාසල් පැමිණීම, පැවරුම් සිදුකිරීම, විභාග සඳහා සූදානම් වීම වැනි කරුණු ඔස්සේ නිගමනයන්ට එළඹිය හැකි ය. සමස්තයක් වශයෙන් ගත් කල්හි දරුවන්ගේ මව හෝ පියා විදේශගතවීම දරුවන් බහුතරයකගේ අධ්‍යාපනයට සෘණාත්මකව බලපෑමක් ඇති කරන බව නිගමනය කළ හැකි ය.

මුඛ්‍ය පද: *දරුවන්ගේ අධ්‍යාපන තත්වය, අධ්‍යාපන සාර්ථකත්වය, දෙමාපියන් විදේශගත වීම, මනෝ සමාජීය බලපෑම, විදේශගත දෙමාපියන්, විදේශගත ශ්‍රමිකයන්, ළමා සංවර්ධනය*

Financial Difficulties and Coping Strategies among First-Year Undergraduates from Low-Income Families: A Study at the University of Ruhuna

Lehan, T.
University of Ruhuna, Sri Lanka
timodhlehan@gmail.com

Abstract

Despite Sri Lanka's free higher education system, students from low-income families continue to experience financial difficulties that may affect their academic participation and well-being. Previous studies have examined financial stress among university students, but limited attention has been given to first-year undergraduates from low-income families within a specific Sri Lankan university context. A purposive sample of 22 financially verified first-year undergraduates was selected using a qualitative-dominant mixed-methods design. Data were collected through semi-structured interviews and a questionnaire containing Likert-scale and open-ended questions. The collection of data was done by means of semi-structured interviews and a questionnaire with Likert-scale and open-ended questions. Interview and open-ended questionnaire responses were analyzed thematically following Braun and Clarke's (2006) framework, while Likert-scale responses were summarized using descriptive percentages. The analysis identified four themes such as basic living costs, academic expenses, emotional stress, and insufficient support systems. The students commonly had problems in getting meals, paying for transport, and accommodation, as well as, being involved in printing and buying study materials which all affected their academic concentration, participation, and mental well-being. Five main coping strategies were identified: budgeting and expense management, borrowing and social support, part-time or freelance work, emotional and religious coping, and academic adaptation. Although these strategies demonstrate students' resilience, they are often insufficient to fully address financial hardship. The findings highlight the need for strengthened university financial assistance, affordable meals and accommodation, accessible academic resources, and financial literacy support to promote equitable access to higher education.

Keywords: *Financial resilience, Undergraduate students, Low-Income Families*

Sustainable Business, Management and Economic Development



Impact of Brand Management on Business Sustainability: A Study Based on Small and Medium Enterprises (SMEs) in Sri Lanka

Godakanda, G. K. S. S. [1]*, Aluthgedara, D. G. L. S. P. [2]
[1]Department of Mass Communication, University of Kelaniya, Sri Lanka
[2]Department of Social Statistics, University of Kelaniya, Sri Lanka
*sularigodakanda19@gmail.com

Abstract

කොවිඩ් - 19 වෛරසය, ආර්ථික, අධ්‍යාපනික, සමාජීය, දේශපාලන, පාරිසරික ඇතුළු බොහෝ පැතිකඩයන්ගෙන් ගෝලීය වශයෙන් විවිධ බලපෑම් නිර්මාණය කිරීමට සමත් විය. වෛරසයේ විවිධ බලපෑම් පිළිබඳව පර්යේෂණ ගණනාවක් සිදුකර තිබෙන අතර මෙම පර්යේෂණය මගින් ග්‍රාමීය හා නාගරික කුටුම්බ පරිභෝජන වියදමට කොවිඩ් - 19 වෛරසයෙන් සිදු කරනු ලැබූ බලපෑම් කවර ආකාරයෙන් ද යන්න අධ්‍යයනය කරනු ලබයි. එය පර්යේෂණයෙහි මූඛ්‍ය අරමුණ වේ. එමෙන් ම ග්‍රාමීය හා නාගරික වශයෙන් කොරෝනා වෛරසයේ බලපෑම් සන්සන්දනය කිරීම, කුටුම්බ පරිභෝජන වියදමේ විවිධ කාණ්ඩ අනුව වෛරසය මගින් ඇතිකල බලපෑම් හඳුනා ගැනීම ද මෙම පර්යේෂණය මගින් අරමුණු කරගෙන ඇත. මෙහි දී පර්යේෂණය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ නුගේගොඩ ප්‍රදේශයෙන් නාගරික පවුල් 50ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළින් ග්‍රාමීය පවුල් 50ක් වශයෙන් වූ නියැදි භාවිතා කරමින් රැස්කරගත් දත්ත යොදාගෙන ග්‍රාමීය හා නාගරික කුටුම්බ පරිභෝජන වියදමට වෛරසයේ බලපෑම හඳුනාගැනීම සඳහා ග්‍රාමීය හා නාගරික ලෙස වර්ගීකරණයකොට විස්තරාත්මක විශ්ලේෂණයක් හා ආර්ථිකමිතික විශ්ලේෂණය යටතේ බහුගුණ ප්‍රතිපායන ආකෘතිය යොදාගන්නා ලදී. එමගින් ලබාගත් ප්‍රතිඵලවලට අනුව සමස්ත නියැදියෙන් කොවිඩ් - 19 වැළඳුනු පුද්ගලයන්ගෙන් 48%ක් ග්‍රාමීය අංශය තුළ සිටි අතර 52%ක් නාගරික අංශය තුළ විය. එමෙන් ම කොරෝනා හේතුවෙන් ග්‍රාමීය හා නාගරික අංශ දෙකෙහිම කුටුම්බ මාසික ආදායම හා පරිභෝජන වියදම පහළ ගිය බව තහවුරු විය. එහි දී වඩාත් ප්‍රබල පහළ බැසීමක් වාර්තා වූයේ සාපේක්ෂව ග්‍රාමීය අංශයෙනි. කුටුම්බයේ මාසික ආදායම යන විචල්‍යය ග්‍රාමීය හා නාගරික අංශ දෙකෙහි ම කුටුම්බ පරිභෝජන වියදමට ධනාත්මක බලපෑම් ඇතිකරන ලද අතර කුටුම්බය තුළ කොරෝනා වැළඳුනු සාමාජිකයන් සංඛ්‍යාව පරිභෝජන වියදම මත ඍණාත්මක බලපෑම් ඇතිකර තිබේ. එමෙන් ම කුටුම්බ සාමාජිකයකු ලබාගත් එන්නත් ගණන ග්‍රාමීය පරිභෝජන වියදමට ධනාත්මකව බලපා ඇති අතර නාගරික කුටුම්බ සඳහා ඍණාත්මකව බලපා ඇත. වෛරසය පැවති කාලයේදී මාසයක් තුළ නිවසේ රැඳී සිටීමට සිදුවූ දින ගණන ග්‍රාමීය පරිභෝජන වියදමට ඍණාත්මකව බලපා තිබෙන අතර නාගරික කුටුම්බ සඳහා ධනාත්මකව බලපා තිබෙන බව තහවුරු විය. මෙවැනි අනපේක්ෂිත අවස්ථාවන් වල දී එහි බලපෑම් අවම කිරීමට ආර්ථික, සමාජීය හා දේශපාලනික ඒකාබද්ධ ආරක්ෂක වැඩපිළිවෙළක් සකස් කිරීම වැදගත් වේ.

මූඛ්‍ය පද: *පරිභෝජන වියදම, ග්‍රාමීය, නාගරික, කුටුම්බ, කොවිඩ් - 19*

උණවටුන සංචාරක පොලිස් කලාපය තුළ විදේශිකයන්ගේ ආරක්ෂාව, අපරාධ නිවාරණය සහ භෞතික ආරක්ෂණ කළමනාකරණය පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්

ප්‍රියංකර, ජී. ඒ. ජේ.
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
යුරේසියානු සරසවිය, ශ්‍රී ලංකාව
amilajayan@gmail.com

සාරසංක්ෂේපය

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන සංචාරක කර්මාන්තය සුරක්ෂිතව පවත්වා ගැනීම සඳහා විදේශිකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම අත්‍යවශ්‍ය වේ. උණවටුන සංචාරක පොලිස් වසම තුළ විදේශීය සංචාරකයන් ඉලක්ක කරගනිමින් සිදුවන දේපළ අපරාධ, ලැගුම්හල්වල භෞතික ආරක්ෂණ දුර්වලතා සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ දී පවතින සන්නිවේදන අභියෝග විද්‍යාත්මකව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ යි. මේ සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමවේද ඒකාබද්ධ කළ මිශ්‍ර ප්‍රවේශයක් (Mixed Methodology) ඔස්සේ, අහඹු හා අරමුණු සහගත නියැදිකරණය යටතේ විදේශිකයන් 50 ක්, ලැගුම්හල් හිමියන් 20ක් සහ පොලිස් නිලධාරීන් 10 දෙනෙකුගෙන් ව්‍යුහගත ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස් කරන ලදී. දත්ත විශ්ලේෂණයේදී අනාවරණය වූයේ සුලභ ක්‍රියාකාරකම් න්‍යාය (Routine Activity Theory) තහවුරු කරමින්, කුඩා පරිමාණ විලා සහ ලැගුම්හල්වලින් 78% ක ප්‍රමිතිගත ආරක්ෂිත සේප්පු නොමැති වීමත්, 68% ක Night Vision සහිත CCTV පද්ධති අක්‍රීයවීමත් හේතුවෙන් සංචාරකයන් අපරාධකරුවන්ගේ පහසු ඉලක්ක බවට පත්ව ඇති බව යි. තව ද, වාර්තා වූ දේපළ අපරාධවලින් 58% ක්ම මධ්‍යම රාත්‍රියෙන් පසු සිදුවන අතර, විදේශිකයන්ගෙන් 62% ක්ම පොලිස් පැමිණිලි ඉදිරිපත් කිරීමේ දී භාෂාමය සහ සන්නිවේදන බාධාවන්ට මුහුණ දීම හේතුවෙන් විමර්ශන කටයුතු සැලකිය යුතු ලෙස ප්‍රමාද වන බව තහවුරු විය. මෙයට පිළියම් වශයෙන්, සංචාරක ලැගුම්හල් සඳහා අවම භෞතික ආරක්ෂණ ප්‍රමිතීන් නීතිගත කිරීම, පාරිසරික සැලසුම්කරණය (CPTED) නිසි පරිදි ක්‍රියාත්මක කිරීම, භාෂා ගැටලු ජයගැනීමට AI පරිවර්තන මෙවලම් භාවිතය සහ ප්‍රජාව හා පොලිසිය අතර ක්ෂණික තොරතුරු හුවමාරුවට ඩිජිටල් ප්‍රජා පොලිස්කරණ (Digital Community Policing) ජාලයක් ස්ථාපිත කිරීම මෙම අධ්‍යයනය මඟින් නිර්දේශ කරනු ලබයි.

මුඛ්‍ය පද: *සංචාරක ආරක්ෂාව, භෞතික ආරක්ෂණය, පාරිසරික සැලසුම්කරණය (CPTED), ප්‍රජා පොලිස්කරණය, සන්නිවේදන බාධක*

පශ්චාත් නූතන සංකල්පය පිළිබඳව සමාජ විද්‍යාත්මක න්‍යායන් ගොඩ නැඟීම හා වර්ධනය: Zygmunt Bauman ගේ Liquid Modernity (ද්‍රවශීලී නූතනත්වය) ඇසුරින් විග්‍රහ කිරීම

කළුආරච්චි, ටී.
යුරේසියානු සරසවිය, ශ්‍රී ලංකාව
447tharaka@gmail.com

සාරසංක්ෂේපය

සමාජ විද්‍යාව යනු ආනුභවික නිරීක්ෂණවලින් ලබා ගත් අර්ථකථන සාමාන්‍යකරණයන් මත පදනම්ව සමාජයේ 'තර්කනය' අවබෝධ කර ගැනීමට උත්සාහ කරන, සමාජ සම්බන්ධතා සහ කොන්දේසි පිළිබඳ විමර්ශනය හා සම්බන්ධ විනය වන බැවින් එය පැහැදිලිව ම නිෂ්පාදනයක් වන අතර, එබැවින්, නූතනවාදය හා පශ්චාත් නූතනවාදය යනු නවීකරණ ව්‍යාපෘතියකි. මෙම අධ්‍යයන පත්‍රිකාව තුළින් මූලික වශයෙන් "පශ්චාත් නූතන සංකල්පය පිළිබඳව සමාජ විද්‍යාත්මක න්‍යායන් ගොඩ නැඟීම හා වර්ධනය Zygmunt Bauman ගේ Liquid Modernity (ද්‍රවශීලී නූතනත්වය) ඇසුරින් අධ්‍යයනය කිරීම" පිළිබඳ ව ඉදිරිපත් කරයි. සිග්මන් බෝමන් සිය *Liquid Modernity* (2000) ග්‍රන්ථයේ "On Letting Light on to Liquid" නම් ප්‍රවේශය ආරම්භ කරන්නේ භෞතික විද්‍යාත්මක සංකල්පයක් සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක් බවට පරිවර්තනය කරමිනි. ඔහු මෙහි දී ඝන ද්‍රව්‍ය සහ ද්‍රව ද්‍රව්‍ය අතර පවතින මූලික භෞතික වෙනස්කම් සමාජීය ආයතන විග්‍රහ කිරීම සඳහා රූපකයක් ලෙස භාවිත කරයි. මෙකී නූතනවාදී සහ පශ්චාත් - නූතනවාදී ව්‍යාපෘතිය තුළ සමාජීය යථාර්ථයන් විශ්ලේෂණය කිරීම සඳහා සිග්මන් බෝමන් ගේ "ද්‍රවශීලී නූතනත්වය" නම් ප්‍රවේශය සහ පශ්චාත් - නූතන සමාජ විද්‍යාත්මක න්‍යායයන්ගේ වර්ධනය පරීක්ෂාවට ලක් කරයි. අධ්‍යයන ක්‍රමවේදය ලෙස බෝමන්ගේ *Liquid Modernity* (2000) ග්‍රන්ථයේ එන "On Letting Light onto Liquid" ප්‍රවේශය ආශ්‍රිත ගුණාත්මක න්‍යායාත්මක සහ අන්තර්ගත විශ්ලේෂණය භාවිත කර ඇත. එහිදී ඔහු මූලික වශයෙන් භෞතික විද්‍යාත්මක සංකල්පයක් වන ඝන සහ ද්‍රව ද්‍රව්‍යවල ලක්ෂණ සමාජ විද්‍යාත්මක රූපකයන් ලෙස යොදා ගනිමින් නූතන සමාජ ආයතන විශ්ලේෂණය කෙරේ. පර්යේෂණ සොයාගැනීම් අනුව, සාම්ප්‍රදායික 'ඝන නූතනත්වය' තුළ පැවති ආගම, පවුල, ජාතික රාජ්‍යය සහ ස්ථීර රැකියාව වැනි ආයතන මිනිසාට ස්ථාවර සහ නම්‍යශීලී නොවන සීමාවන් පැනවූ අතර, ඒවා කාලය හමුවේ ස්ථාවරව පැවතිණි. නමුත් වර්තමාන 'ද්‍රවශීලී නූතනත්වය' තුළ සමාජීය ආයතන, මානුෂීය සබඳතා සහ අනන්‍යතාවයන් තමන්ගේ නිශ්චිත හැඩය පවත්වා ගැනීමට අපොහොසත් වන අතර, ඒවා තාවකාලික, දියාරු සහ නිරන්තරයෙන් වෙනස් වන ස්වභාවයක් ගනී. මෙහි දී කාලය විසින් අවකාශය යටපත් කරනු ලබයි. සමස්තයක් ලෙස 18 වන සියවසේ බුද්ධෝත්පාද කාලයේ සිට පැවත ආ ප්‍රබුද්ධත්වයේ නූතනවාදී විශ්වීය සත්‍යයන් සහ වටිනාකම්වලට එරෙහි ප්‍රතික්‍රියාවක් ලෙස පශ්චාත් -නූතන සංශයවාදය මතුවී ඇත. බෝමන්ගේ ද්‍රවශීලී නූතනත්ව සංකල්පයට අනුව, කිසිදු සමාජීය ස්වරූපයක් හෝ බන්ධනයක් තමන්ගේ හැඩය දිගුකාලීනව පවත්වා ගැනීමට තරම් ස්ථාවර නො වන අස්ථාවර සමාජ යථාර්ථයක් වර්තමානය තුළ ස්ථාපිත වී ඇති බව නිගමනය කළ හැකිය. එසේ ම මෙය න්‍යායාත්මක විග්‍රහය යනු හුදෙක් ශාස්ත්‍රීය විග්‍රහයක් පමණක් නොව, වර්තමාන සමාජයේ පවතින අස්ථාවරත්වය සහ ගැටලු තේරුම් ගනිමින් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ප්‍රායෝගිකව යොදාගත හැකි ප්‍රබල ආකෘතියකි. ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ සමාජ වැඩකරන්නන්ට මතක් කර දෙන්නේ "පැරණි ස්ථාවර රාමු තුළ තබා වර්තමාන මිනිසාගේ ගැටලු විසඳිය නො හැකි" බව යි. එබැවින් වර්තමාන සමාජයේ පවතින වෙනස්වන සුළු, අස්ථාවර සහ නම්‍යශීලී ස්වභාවයට ගැළපෙන පරිදි ප්‍රතිපත්ති සහ සමාජ සේවාවන් ද නම්‍යශීලී, ප්‍රවේශ විය හැකි සහ මානුෂීය ලෙස සකස් විය යුතු ය.

මුඛ්‍ය පද : *පශ්චාත් නූතනවාදය, සමාජ ආයතන, ද්‍රවශීලී නූතනත්වය, සමාජ ව්‍යුහ, ඝන නූතනත්වය*

ඩිජිටල්කරණය සහ ආර්ථික අස්ථායීතාවයේ සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ නැඟී එන සංවිධානාත්මක අපරාධ : සයිබර් අපරාධ කේන්ද්‍ර, මූල්‍ය වංචා සහ නීතිමය ප්‍රතිචාර පිළිබඳ විශ්ලේෂණයක්

සඳමාලි, යූ. ජී. එන්.
සමාජ විද්‍යා අධ්‍යයනාංශය,
මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
රුහුණ විශ්වවිද්‍යාලය
nuwanthikas99@gmail.com

සාරසංක්ෂේපය

ශ්‍රී ලංකාවේ සංවිධානාත්මක අපරාධ නව සමාජ ආර්ථික යථාර්ථයක් නිර්මාණය කරයි. ආර්ථික අස්ථායීතාවය, වේගවත් ඩිජිටල්කරණය සහ භූ දේශපාලනික ව්‍යාප්තිය හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ අපරාධ භූ දර්ශනයේ සිදුවන වේගවත් පරිවර්තනය මෙම අධ්‍යයනය මඟින් විමර්ශනය කර ඇත. ආර්ථික අස්ථායීතාවය, වේගවත් ඩිජිටල්කරණය සහ භූ දේශපාලනික සාධක හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ සිදුවන අපරාධ භූ දර්ශනයේ පරිවර්තනය සහ නැඟී එන සංවිධානාත්මක අපරාධ ප්‍රවණතා හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ යි. ගිනිකොණදිග ආසියාවේ සිදු කරන ලද දැඩි මර්දන හේතුවෙන් අවතැන් වූ ජාත්‍යන්තර "ව්‍යාජ කප්පම් මධ්‍යස්ථාන" සහ ජාත්‍යන්තර සයිබර් අපරාධ සඳහා ශ්‍රී ලංකාව මෑතක දී ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් බවට පත්ව ඇත. සංකීර්ණ cryptocurrency වංචා සහ Pig butchering ආකාරයේ ආයෝජන වංචා සිට උසස් වෙළඳ පදනම් මුදල් විශුද්ධිකරණ ක්‍රම දක්වා විහිදෙන මූල්‍ය අපරාධ රටේ මූල්‍ය අඛණ්ඩතාවයට බරපතල තර්ජනයක් වන මට්ටමකට ළඟා වී ඇත. ඒ සමඟම සාම්ප්‍රදායික තර්ජන ද පරිණාමය වී ඇති අතර ඩිජිටල් සන්නිවේදන වේදිකා භාවිතා කිරීමත්, කාන්තාවන්ට සහ දරුවන්ට එරෙහිව තාක්ෂණය ප්‍රමුඛ කොටගත් අපරාධ ඉහළ යාමත් ඒ අතර වේ. නීතිය ක්‍රියාත්මක කිරීමේ නවතම දත්ත, නියාමන වාර්තා සහ අධිකරණ පූර්වාදර්ශ පිළිබඳ ගුණාත්මක විශ්ලේෂණයක් යොදා ගනිමින්, මෙම ප්‍රවණතා සඳහා බලපාන සමාජ - ආර්ථික සාධක සහ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක සහ නියාමන රාමු තුළ පවතින පද්ධතිමය දුර්වලතා මෙහි දී විශ්ලේෂණය වේ. අධ්‍යයනයේ ප්‍රතිඵල මඟින් පැහැදිලිව පෙන්වා දෙන්නේ සයිබර් අපරාධ කේන්ද්‍ර සහ සංකීර්ණ මූල්‍ය වංචා වැනි නවීන අපරාධ ජාලවල වේගවත් වර්ධනයට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාවේ වර්තමාන නීතිමය රාමුව ප්‍රමාණවත් නොවන බව යි. සයිබර් අපරාධ කෘතිම බුද්ධිය නැඹුරු ස්වයංක්‍රීය නියෝජිතයන් මඟින් සැපයුම් දාම සහ අනන්‍යතාවය ඉලක්ක කරගෙන කාර්මික මට්ටමේ මෙහෙයුම් බවට පත්වී ඇත. වර්තමාන මූල්‍ය පද්ධතිය තුළ කෘතිම බුද්ධිය මත පදනම් වූ නවීන වංචා ක්‍රම මූල්‍ය වංචාවල නව ප්‍රවණතාවක් ලෙස හඳුනාගත හැක. මෙම තර්ජන ඵලදායී ලෙස මැඩපැවැත්වීම සඳහා ශක්තිමත් නීතිමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, නීතිය ක්‍රියාත්මක කරන ආයතන තුළ උසස් තාක්ෂණික ධාරිතාව ගොඩනැගීම සහ ජාත්‍යන්තර නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ වැඩිදියුණු කළ සහයෝගීතාවයක් ඇති කිරීම පිළිබඳ හදිසි අවශ්‍යතාවක් පවතින බවට නිගමනය කළ හැක.

මුඛ්‍ය පද: *අපරාධකරුවන්, ඩිජිටල්කරණය, නැඟී එන අපරාධ, සයිබර් අපරාධ කේන්ද්‍ර, මූල්‍ය වංචා, නීතිමය ප්‍රතිචාර*

මහනුවර උඩපළාත ප්‍රාදේශීය බලප්‍රදේශයේ ක්වාසි උසාවිය වෙත පැමිණෙන කාන්තාවන්ගේ විවාහක නොගැළපීම්, ලිංගික අතෘප්තිය සහ මානසික සෞඛ්‍ය මට්ටම පිළිබඳ අධ්‍යයනයක්

නසීරා, එම්. සී. එස්.
සමාජ වැඩ හා සමාජීය විද්‍යා අධ්‍යයනාංශය,
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
යුරේසියානු සරසවිය, ශ්‍රී ලංකාව
nazeeraifthikar165@gmail.com

සාරසංක්ෂේපය

විවාහක ආරවුල් සහ ආගමික නෛතික ක්‍රියාවලිය කාන්තාවන්ගේ මානසික යහපැවැත්ම කෙරෙහි ප්‍රබල බලපෑමක් එල්ල කරන අතර, මෙම අධ්‍යයනය මඟින් මහනුවර උඩපළාත ක්වාසි අධිකරණය වෙත පැමිණෙන මුස්ලිම් කාන්තාවන්ගේ විවාහක නො ගැළපීම්, ලිංගික අතෘප්තිය සහ ඔවුන්ගේ මානසික සෞඛ්‍ය මට්ටම අතර පවතින සබඳතාව විමර්ශනය කරන ලදී. ප්‍රමාණාත්මක හරස්කඩ අධ්‍යයන සැලැස්මක් යටතේ අරමුණු සහගත නියැදිකරණ ක්‍රමවේදය මඟින් ක්වාසි අධිකරණය වෙත පැමිණි විවාහක කාන්තාවන් 100 දෙනෙකු (N = 100) නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. දත්ත රැස්කිරීම සඳහා Kansas Marital Satisfaction Scale (KMSS), Female Sexual Function Index (FSFI), Depression Anxiety Scale (DASS 21), General Health Questionnaire (GHQ 12) සම්මත මිනුම් උපකරණ භාවිත කළ අතර, උඩපළාත ක්වාසි අධිකරණයේ පූර්ව නිල පර්යේෂණ සහ ආචාරධර්මීය අනුමැතිය (අනුමැති අංක : QC/UDP/RES/01) සහ සහභාගීවන්නන්ගේ ලිඛිත දැනුවත් කැමැත්ත (Informed Consent) සහිතව උපරිම රහස්‍යභාවය සුරක්ෂිත කරමින් දත්ත එක්රැස් කරන ලදී. SPSS මෘදුකාංගය ඔස්සේ සිදුකළ සංඛ්‍යානමය විශ්ලේෂණයේ දී (Descriptive Statistics Pearson Correlation and Multiple Regression), සහභාගී වූවන්ගෙන් 87% ක්ම දැඩි විවාහක නො ගැළපීම් සහ අතෘප්තිය වාර්තා කර ඇති බව අනාවරණය විය. තව ද, විවාහක නො ගැළපීම සහ මානසික පීඩනය (DASS - 21 හි විශාදය, කාංසාව සහ ආතතිය) අතර සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු ධන සහසම්බන්ධතාවක් ද ($p < 0.001$), ලිංගික අතෘප්තිය (අඩු FSFI අගයන්) පොදු මානසික සෞඛ්‍ය ගැටලු (GHQ - 12) සමඟ ඍජු සහසම්බන්ධතාවක් ද ($p < 0.01$) පෙන්නුම් කළ අතර, රෙග්‍රේෂන් විශ්ලේෂණය, අයහපත් මානසික සෞඛ්‍ය මට්ටම තීරණය කරන ප්‍රබල සාධක වේ. මෙම සොයාගැනීම් අනුව, ක්වාසි අධිකරණ පද්ධතිය හා සම්බන්ධ වන කාන්තාවන්ගේ මානසික සෞඛ්‍යය නගා සිටුවීම උදෙසා වෘත්තීය සායනික මනෝවිද්‍යාත්මක සේවාවන්, අනිවාර්ය පූර්ව - නෛතික විවාහ උපදේශන සහ ආයතනික මනෝ - සමාජයීය සහායක වැඩසටහන් කඩිනමින් ස්ථාපිත කිරීමේ ප්‍රායෝගික අවශ්‍යතාව අවධාරණය කෙරේ.

මුඛ්‍ය පද : *විවාහක නො ගැළපීම, ලිංගික අතෘප්තිය, මානසික සෞඛ්‍යය, ක්වාසි අධිකරණය, මුස්ලිම් කාන්තාවන්, සායනික මනෝවිද්‍යාව*

මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ රාජකාරිවල නිරත ශ්‍රී ලංකා පොලිස් නිල සුනඛයන්ගේ සෞඛ්‍ය අවදානම පිළිබඳ අපරාධ විද්‍යාත්මකව විමර්ශනාත්මක අධ්‍යයනයක්

සුමනසේකර, ඒ. එම්. එස්. ඩී.
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
යුරේසියානු සරසවිය, ශ්‍රී ලංකාව
dinarasenudi5@gmail.com

සාරසංක්ෂේපය

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය මර්දන මෙහෙයුම්වල දී පොලිස් නිල සුනඛ සේවය අත්‍යවශ්‍ය උපායමාර්ගික සම්පතකි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ මත්ද්‍රව්‍ය සොයාගැනීමේ රාජකාරිවල නිරත නිල සුනඛයන් මුහුණ දෙන සෞඛ්‍ය අවදානම්, මෙහෙයුම් ආරක්ෂාව සහ සුභසාධන තත්ත්වය අපරාධ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විමර්ශනය කිරීම යි. මෙරට ප්‍රධාන නිල සුනඛ කොට්ඨාසය පිහිටි අස්ගිරිය මූලික කරගනිමින්, වසර 5ක (2021 - 2026 මේ දක්වා) සංඛ්‍යාත්මක දත්ත සහ මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදුකරන ලදී. මෙහෙයුම් කාර්ය බහුලත්වය සහ පොලිස් ඒකකයේ රහස්‍යභාවය හා ආරක්ෂිත සංවේදීතාව හේතුවෙන් පැවැති දත්ත සීමිතභාවය හමුවේ අරමුණු සහගත නියැදීම් ක්‍රමවේදය මඟින් සුනඛ හසුරුවන්නන්ගෙන් ප්‍රශ්නාවලි මඟින් ද, පශු වෛද්‍යවරුන් සහ ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් සම්මුඛ සාකච්ඡා මඟින් ද දත්ත රැස්කර ගන්නා ලදී. ප්‍රශ්නාවලි දත්තවල තහවුරුභාවය පරීක්ෂා කරමින්, දත්ත විග්‍රහය සඳහා විස්තරාත්මක සංඛ්‍යානය සහ තේමාත්මක විශ්ලේෂණය යොදාගන්නා ලදී. අධ්‍යයනයට අනුව, දිවයින පුරා නිල සුනඛ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම, ප්‍රාදේශීය සායනික පහසුකම් ඌණතාව සහ දේශගුණික බලපෑම් ප්‍රධාන ගැටලු ලෙස හඳුනා ගැනිණි. සමබල ආහාර ලබාදුන්න ද, නිතිපතා පරීක්ෂණ සිදුවන්නේ ප්‍රධාන ඒකකයේ පමණක් වන අතර අනෙක් ප්‍රදේශවල දී එය සිදුවනුයේ මාස 6 කට වරක් හෝ රෝගාතුර වූ විට පමණි. හසුරුවන්නන්ගේ හදිසි අවස්ථා පිළිබඳ දැනුම අඩුකම මෙන්ම ආර්ථික අපහසුතා නිසා කෘතිම මත්ද්‍රව්‍ය ගෙන්වා ගැනීමේ නොහැකියාව සහ ඒ ආශ්‍රිත නීතිමය තහවුරුභාවය අවම වීම ද අනාවරණය විය. විශේෂයෙන්ම, පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කළ ද, විෂවේදී පරීක්ෂණ නොකිරීම නිසා අවම විෂ නිරාවරණයකින් පවා සිදුවන මරණීය හේතු නිශ්චිත ව තහවුරු කරගැනීමට නොහැකි වී ඇත. පොලිස් නිල සුනඛයන්ගේ සෞඛ්‍ය අවදානම් අවම කර මෙහෙයුම් සාර්ථක කිරීමට නම්, පරීක්ෂණ අනිවාර්ය කිරීම, හසුරුවන්නන්ට හදිසි ආපදා පුහුණුව ලබාදීම සහ ආරක්ෂිත උපකරණ සඳහා නීතිමය හා ආර්ථික ප්‍රතිපාදන සැලසීම පර්යේෂණය මඟින් යෝජනා කෙරේ.

මුඛ්‍ය පද: *නිල සුනඛයින්, මත්ද්‍රව්‍ය නිරාවරණය, විෂවේදී පරීක්ෂණ, ක්ෂේත්‍ර මෙහෙයුම් අවදානම්, අස්ගිරිය පොලිස් ඒකකය*

ශ්‍රී ලංකාවේ මැලේරියා වසංගත ඉතිහාසය සහ Covid-19 ව්‍යාප්තිය: වසංගතයන්හි සමාජීය බලපෑම පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

නවරත්න, එන්. ආර්. එම්. ඩී. එම්.
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය,
රුහුණ විශ්වවිද්‍යාලය
dulikamadu803@gmail.com

සාරසංක්ෂේපය

වසංගත යනු සෞඛ්‍ය අර්බුදයක් පමණක් නොව, මානව සමාජයේ ආර්ථික හා සංස්කෘතික පැවැත්ම වෙනස් කරන සාධකයකි. ශ්‍රී ලංකා ඉතිහාසයේ දැකිය හැකි 1930 දශකයේ මැලේරියා වසංගතය සහ Covid - 19 ව්‍යාප්තිය යනු රටේ සමාජ ව්‍යුහයට දැඩි ව බලපෑ අවස්ථා දෙකකි. එකිනෙකට වෙනස් කාලසීමාවන් දෙකක මතු වූ මෙම වසංගත මගින් ලාංකේය සමාජයට එල්ල වූ බලපෑම පිළිබඳව මෙහිදී අවධානය යොමු කෙරේ. ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව වන්නේ "ශ්‍රී ලංකාවේ මැලේරියා සහ Covid - 19 වසංගත මගින් සමාජයට සිදු වූ බලපෑමෙහි ඇති සමානතා සහ වෙනස්කම් කවරේද?" යන්න සොයා බැලීම යි. ඒ අනුව සිදුකරන ලද මෙම පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ අරමුණ වන්නේ "මැලේරියා සහ Covid - 19 වසංගත මගින් ශ්‍රී ලාංකේය සමාජයට ඇති කළ බලපෑම සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමයි." 2026 වර්ෂයේ සිදු කරන මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලද අතර, එහි දී දත්ත එක්රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර නො වන අධ්‍යයනය යටතේ ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනය කරන ලදී. එමෙන් ම දත්ත විශ්ලේෂණයේ දී යුග ද්විත්ත්වයේ පැවති සමාජ, ආර්ථික හා දේශපාලනික පසුබිම සළකා බලමින් සන්දර්භ විශ්ලේෂණය, තේමාත්මක සහ ඓතිහාසික සංසන්දනාත්මක විශ්ලේෂණ ක්‍රමවේදයන් භාවිත කරමින් නිගමනවලට එළඹෙන ලදී. පර්යේෂණ සොයාගැනීම්වලට අනුව, මෙම අධ්‍යයනය මගින් 1934 - 1935 මැලේරියා වසංගතය සහ Covid - 19 සමය අතර පැවති සමානකම් අනාවරණය විය. එහි දී, එදා පැවති 'කැඳ දන්සල්' වැනි ප්‍රජා ආරක්ෂණ ජාල Covid - 19 සමයේදී ස්වයංක්‍රියව ප්‍රතිනිර්මාණය වූ අතර, එදා පුවත්පත් මගින් ඇති කළ "මදුරු භීතිකාව" මෙදා සමාජ මාධ්‍ය ඔස්සේ "ඩිජිටල් තොරතුරු වසංගතයක්" බවට පත් විය. බ්‍රිතාන්‍යයන් දේශීය වෛද්‍ය ක්‍රමය අත්හැරිය ද, Covid - 19 සමයේ දී රාජ්‍ය යාන්ත්‍රණය විසින් දේශීය ප්‍රතිකාර දේශපාලනික ප්‍රචාරණයට යොදාගැනීමේ වෙනස්ම සංස්කෘතියක් මතු වූ අතර, එදා පැවති බෝග හුවමාරුව වෙනුවට මෙදා ඩිජිටල් පදනම් කරගත් අවිධිමත් ණය හුවමාරු ක්‍රම ග්‍රාමීයව නිර්මාණය විය. තව ද, යුග දෙකෙහි දී ම කාන්තාවන් ප්‍රජා සෞඛ්‍ය හා ආහාර කළමනාකරණයේ "අදෘශ්‍යමාන සෞඛ්‍ය ශ්‍රමිකයන්" ලෙස ක්‍රියා කර ඇති බව තහවුරු වේ. දැවැන්ත තාක්ෂණික පරතරයක් පැවතිය ද, ආපදා හමුවේ ලාංකීය සමාජය දක්වන "සමාජ - ජීව විද්‍යාත්මක ආරක්ෂණ රටාව" එකම අච්චුවක පවතින බව මෙම පර්යේෂණය මඟින් අනාවරණය විය. තාක්ෂණය මඟින් සෞඛ්‍ය පිරිවැය අවම කළ ද, එය පැරණි යටත් විජිත පන්තිමය විෂමතාවම "ඩිජිටල් පරතරයක්" ලෙස නැවත නිෂ්පාදනය කර ඇති බැවින්, අනාගත වසංගත පාලනයට මේකි ඓතිහාසික - සමාජීය හැසිරීම් පදනම් කරගත් ප්‍රවේශයක් අත්‍යවශ්‍ය බව මෙහි දී නිගමනය කළ හැක.

ප්‍රමුඛ පද: *අර්බුද කළමනාකරණය, කොවිඩ් - 19 වසංගතය, මැලේරියා වසංගතය, සමාජ බලපෑම, සංසන්දනාත්මක විශ්ලේෂණය*

The Roots of Peace and Non-Violence: A Path to Social Cohesion

Ven. Saw Ma Na
Postgraduate Institute of Pali and Buddhist Studies,
University of Kelaniya, Sri Lanka
sawsawmana@gmail.com

Abstract

In today world, marked by global conflicts, social polarization, and heightened ideological tension, social cohesion has become a vital necessity. Buddhist philosophy provides a robust foundation linking individual mental tranquility directly to broader societal peace. This paper explores how the foundational Buddhist principles of non-violence (*ahiṃsā*) and loving-kindness (*mettā*) serve to foster peaceful coexistence and harmony within society. The objectives are "To systematically examine the core concepts of peace and non-violence (*ahiṃsā*) as articulated in Buddhist philosophy", "To evaluate how individual mental cultivate peace influences and shapes broader social cohesion", "To identify practical Buddhist approaches for mitigating conflict and promoting harmonious living in diverse societies". This study employs a qualitative, text-based research methodology. It relies on textual analyses of foundational Pāli canonical discourses, such as the Karaṇīyamettā Sutta and the Dhammapada, alongside historical literature on Buddhist philosophy and modern academic focus, using a comparative conceptual framework. The realization that all phenomena arise in dependent origination (paṭiccasamuppāda) reduces ego-centric attachment and fosters deep empathy (anukampā) toward others. The systematic cultivation of loving-kindness (*mettā*), compassion (*karuṇā*), sympathetic joy (*muditā*), and equanimity (*upekkhā*) acts as the primary antidote to group polarization and prejudice. Non-violence expressed through body, speech, and mind (*kāyakamma, vacīkamma, manokamma)* restrains physical aggression, harsh speech, and hate-speech, thereby strengthening mutual trust in the community. The Sangha's governance model characterized by regular communal harmony (*samagga*), democratic deliberation, and equitable sharing offers a historical archetype for maintaining social democracy and cohesion. Buddhist philosophy is not merely a theoretical framework. It provides a practical roadmap for social harmony. True peace does not originate from external structures alone, but from the cultivation of inner peace (*ajjhatta-santi*) within the individual. By integrating the Buddhist traditions of non-violence, patience (*khanti*), and mutual respect into modern social frameworks, contemporary societies can resolve deep-seated conflicts and build resilient social cohesion. So, Buddhas path of peace and non-violence is not merely a religious practice. It serves as a timeless, robust framework that cultivates social cohesion and harmony by first establishing tranquility within the individual heart.

Keywords: *Global Conflicts*, *Social Polarization*, *Ideological Tension*, *Mitigating Conflict*, *Communal Harmony*

මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය මඟින් ආර්ථික ප්‍රබෝධය සහ පුද්ගල ජීවන තෘප්තිය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ මනෝවිද්‍යාත්මක විශ්ලේෂණයක් (බස්නාහිර පළාතේ ලෝක බැංකු ආධාරිත මාර්ග ව්‍යාපෘති ඇසුරින්)

ප්‍රනාන්දු, ඩී. සී. ඒ. සී. පී.
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
යුරේසියානු සරසවිය, ශ්‍රී ලංකාව
chamilafernando325@gmail.com

සාරසංක්ෂේපය

මෙම අධ්‍යයනය මඟින් බස්නාහිර පළාතේ ලෝක බැංකු ආධාරිත මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය මඟින් ඇතිවන ආර්ථික ප්‍රබෝධය, පුද්ගල ජීවන තෘප්තිය සහ මානසික යහපැවැත්ම අතර පවතින සම්බන්ධතාව මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයනය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ කොට්ටාව, හෝමාගම, වග, කළුඅග්ගල හා පාදුක්ක සහ කළුතර දිස්ත්‍රික්කයේ මෝල්කාව, පාලින්දනුවර හා බදුරලිය යන මාර්ග ව්‍යාපෘති ආශ්‍රිත ප්‍රදේශ තෝරා ගන්නා ලදී. අරමුණුගත නියැදිකරණ ක්‍රමය භාවිත කරමින් මාර්ග භාවිත කරන්නන්, ප්‍රදේශවාසීන් සහ මාර්ග ආශ්‍රිත ආර්ථික කටයුතුවල නිරත පුද්ගලයන් ඇතුළත් ප්‍රතිචාරකයන් 50 දෙනෙකු නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. දත්ත 2026 ජූනි මාසයේ දී ලයිකට් පරිමාණ ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්නාවලියක් මඟින් රැස්කර Microsoft Excel භාවිතයෙන් විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම මඟින් විශ්ලේෂණය කරන ලදී. ප්‍රතිඵල අනුව, ප්‍රතිචාරකයන්ගෙන් 90% ක් දෛනික ගමන් කාලය අඩුවී ඇති බවත්, 96% ක් ගමනාගමන පහසුව වැඩි වී ඇති බවත්, 84% ක් ප්‍රවාහන වියදම් අඩුවීම හේතුවෙන් මාසික ඉතිරිය වැඩිවී ඇති බවත් අනාවරණය විය. තවද, 96% ක් ගමනාගමන ආතතිය අඩු වී ඇති බවත්, 100% ක් සමාජ සබඳතා සහ පුද්ගලික සතුට වැඩිදියුණු වී ඇති බවත් පෙන්වා දී ඇත. මෙම සොයාගැනීම් යටිතල පහසුකම් සංවර්ධනය මඟින් ආර්ථික අවස්ථා, ගමනාගමන පහසුව සහ පුද්ගල යහපැවැත්ම වැඩිදියුණු කළ හැකි බව පෙන්වා දෙන පෙර ජාත්‍යන්තර අධ්‍යයනවල සොයාගැනීම් සමඟ සාමාන්‍යයෙන් අනුකූල වේ. අධ්‍යයනයේ සොයාගැනීම් Infrastructure-Led Growth Theory" Capability Approach සහ Subjective Well-Being Theory සමඟ ද අනුකූල වන අතර, මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය භෞතික හා ආර්ථික ප්‍රතිලාභ ඉක්මවා පුද්ගලයන්ගේ මානසික හා සමාජීය යහපැවැත්ම සහ ජීවන තෘප්තිය වර්ධනය කිරීමට ද දායක වන බව පෙන්වා දෙයි. එබැවින්, මෙම අධ්‍යයනයේ ප්‍රධාන දායකත්වය වන්නේ මාර්ග සංවර්ධනය ආර්ථික වර්ධනයේ මෙවලමක් ලෙස පමණක් නොව, මානව යහපැවැත්ම සහ ජීවන තත්ත්වය ප්‍රවර්ධනය කරන මනෝවිද්‍යාත්මක හා සමාජීය සංවර්ධන සාධකයක් ලෙස ද සලකා බැලිය යුතු බව පෙන්වා දීම යි. එමඟින් අනාගත සංවර්ධන සැලසුම්කරණයේ දී ආර්ථික දර්ශක සමඟ මානසික යහපැවැත්ම, සමාජීය යහපැවැත්ම සහ ජීවන තෘප්තිය ද ඇතුළත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.

මුඛ්‍ය පද: *මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය, ආර්ථික ප්‍රබෝධය, ජීවන තෘප්තිය, මානසික යහපැවැත්ම, ගමනාගමන ආතතිය, ලෝක බැංකු ආධාරිත ව්‍යාපෘති*

ශ්‍රී ලංකාවේ ඩිජිටල් ඡන්ද පද්ධතියක් හඳුන්වාදීම කෙරෙහි බලපාන සංරෝධක පිළිබඳ අධ්‍යයනයක්

ගුණවර්ධන, ආර්. ඒ. ඩී.[1]*, භාෂණ, එම්.[2]
[1,2]තාක්ෂණ පීඨය,
යුරේසියානු සරසවිය, ශ්‍රී ලංකාව
*rg8473@gmail.com

සාරසංක්ෂේපය

මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් ඡන්ද පද්ධතියක් හඳුන්වාදීම පිළිබඳ මහජන අදහස් හඳුනාගැනීම සහ එවැනි පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට බලපාන ප්‍රධාන සාධක විශ්ලේෂණය කිරීම සිදුකරන ලදී. සාම්ප්‍රදායික කඩදාසි පදනම් කරගත් ඡන්ද ක්‍රමයට විකල්පයක් ලෙස ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීමේ හැකියාව පැවතිය ද, සයිබර් ආරක්ෂාව, දත්ත ආරක්ෂාව, තාක්ෂණික යටිතල පහසුකම්, නීතිමය රාමුව සහ මහජන විශ්වාසය සම්බන්ධ ගැටලු හඳුනාගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අවශ්‍යතාවයක් විය. ඒ අනුව ඩිජිටල් ඡන්ද පද්ධතියක් පිළිබඳ මහජන ආකල්ප හඳුනාගැනීම, එය හඳුන්වාදීමට බලපාන ප්‍රධාන සාධක හඳුනාගැනීම සහ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගැනීම අරමුණු කරමින් පර්යේෂණය සිදුකරන ලදී. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ නියෝජනය කළ ප්‍රතිචාර දැක්වූවන් 107 දෙනෙකුගෙන් ප්‍රශ්නාවලියක් මඟින් දත්ත රැස් කරන ලද අතර ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම මඟින් ද, විවෘත ප්‍රශ්නවලින් ලැබුණු දත්ත තේමාවන් අනුව විශ්ලේෂණය කරන ලදී. ප්‍රතිඵල අනුව, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 85.05% ශ්‍රී ලංකාව තුළ ඩිජිටල් ඡන්ද පද්ධතියක් හඳුන්වා දිය යුතු බවත්, 77.57% අනාගතයේ එවැනි පද්ධතියක් භාවිත කිරීමට කැමති බවත් ප්‍රකාශ කර තිබුණි. එමෙන් ම 78.50% ක් ඩිජිටල් ඡන්ද ක්‍රමය කඩදාසි ඡන්ද ක්‍රමයට වඩා පහසු බව පිළිගෙන තිබූ අතර, 75.70%ක් මහජන දැනුවත්භාවය එවැනි පද්ධතියක් සාර්ථකව හඳුන්වාදීම සඳහා වැදගත් බව සඳහන් කර තිබුණි. තව ද සයිබර් ආරක්ෂාව, තාක්ෂණික යටිතල පහසුකම්, නීතිමය රාමුව, දේශපාලන බලපෑම් සහ මහජන විශ්වාසය ප්‍රධාන අභියෝග ලෙස හඳුනාගෙන තිබුණි. විවෘත ප්‍රශ්නවලදී ද ඩිජිටල් දැනුම හා මහජන දැනුවත් භාවය, සයිබර් ආරක්ෂාව හා දත්ත ආරක්ෂාව, වැඩිහිටි ජනතාවගේ තාක්ෂණික අනුවර්තනය, තාක්ෂණික යටිතල පහසුකම් සහ දේශපාලන විශ්වාසය ප්‍රධාන අභියෝග ලෙස ඉස්මතු වී තිබුණි. ඒ අනුව ඩිජිටල් ඡන්ද පද්ධතියක් සඳහා සැළකිය යුතු මහජන කැමැත්තක් පැවති නමුත්, එය රටපුරා ක්‍රියාත්මක කිරීමට පෙර සීමිත ප්‍රමාණයේ නියමු ක්‍රියාත්මක කිරීමක් සිදුකර පද්ධතියේ ආරක්ෂාව, තාක්ෂණික ක්‍රියාකාරිත්වය සහ මහජන පිළිගැනීම සුදුසු බව නිර්දේශ කරයි.

මුඛ්‍ය පද : *සයිබර් ආරක්ෂාව, මහජන විශ්වාසය, තාක්ෂණික යටිතල පහසුකම්, නියමු ක්‍රියාත්මක කිරීම, ඩිජිටල් ඡන්දය*

Sustainable Environment, Culture and Global Well - being

Spatial Assessment of Disaster Risk and Regional Development Inequality: A GIS-Based Study of Kalutara District, Sri Lanka

Munasinghe, D. L. N. K.
Faculty of Management,
Eurasian Campus, Sri Lanka
nuwanikalhari97@gmail.com

Abstract

Disasters have significant implications for regional development by damaging infrastructure, disrupting economic activities, affecting livelihoods, and intensifying existing social and spatial inequalities. This study assessed the spatial relationship between disaster risk and regional development inequality in Kalutara District, Sri Lanka, using a Geographic Information System (GIS)-based approach. The study aimed to assess the spatial distribution of disaster risk, examine variations in regional development among Divisional Secretariat (DS) Divisions, identify areas experiencing both high disaster risk and low levels of development, and provide recommendations for disaster-resilient regional planning. Secondary spatial and socioeconomic data related to flood and landslide exposure, population vulnerability, infrastructure, accessibility, socioeconomic conditions, and availability of essential services were collected from relevant government and institutional sources. GIS-based spatial analysis was conducted by standardizing and integrating the selected indicators to develop a composite Disaster Risk Index and Regional Development Index. Weighted overlay analysis, spatial overlay techniques, hotspot analysis, and correlation analysis were employed to identify spatial patterns and relationships between disaster risk and regional development conditions. The findings revealed considerable spatial variations in disaster risk and regional development across the DS Divisions of Kalutara District. Several areas were identified where relatively high disaster risk coincided with lower levels of regional development, indicating greater vulnerability and limited capacity to prepare for, respond to, and recover from disasters. The analysis further demonstrated that disaster risk and regional development inequality are spatially interconnected and should be jointly considered in regional planning and decision-making. The study concludes that GIS-based spatial assessment provides an effective tool for identifying vulnerable and development-disadvantaged areas. It recommends prioritizing high-risk and low-development areas for infrastructure improvement, enhancing accessibility to essential services, strengthening community-level disaster preparedness, and incorporating GIS-based disaster risk information into regional development planning and resource allocation in Kalutara District.

Keywords: *Disaster Risk, Regional Development Inequality, GIS - Based Spatial Analysis, Disaster Resilience, Kalutara District*

සමකාලීන දේශපාලන යථාර්ථය සන්නිවේදනය කිරීමෙහි ලා ටෙලිනාට්‍යයේ භූමිකාව (කුඹියෝ සහ සහෝදරයා ටෙලිනාට්‍යය ද්විත්වය ආශ්‍රිතව)

සුබෝධ්‍යා, බී. ටී.
සන්නිවේදනය හා නිර්මාණාත්මක කලා අධ්‍යනාංශය,
ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
bthilini13@gmail.com

සාරසංක්ෂේපය

මෙම පර්යේෂණය මඟින් "කුඹියෝ" සහ "සහෝදරයා" යන නිර්මාණ ද්විත්ත්වය විමර්ශනය කරමින් ජනප්‍රිය ටෙලිනාට්‍ය කලාව ඔස්සේ සමකාලීන දේශපාලන යථාර්ථය සන්නිවේදනය වන ආකාරය පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක නිරත විය. පර්යේෂණයේ ප්‍රධාන මුඛ්‍ය අරමුණ වූයේ, ටෙලිනාට්‍ය ආඛ්‍යාන මඟින් දේශපාලන දෘෂ්ටිවාද නිරූපණය වන ආකාරය සහ එමඟින් ප්‍රේක්ෂකයාගේ සංජානනය කෙරෙහි ඇති කරන බලපෑම හඳුනා ගැනීම යි. "ශ්‍රී ලාංකේය ටෙලිනාට්‍ය සමකාලීන දේශපාලන යථාර්ථය සන්නිවේදනය කිරීමේ දී ප්‍රේක්ෂක දේශපාලන සංජානනය කෙරෙහි බලපෑම් කිරීමට යොදා ගන්නා සාධක කවරේ දැයි යන්න මෙහි මූලික පර්යේෂණ ගැටලුව ලෙස විමර්ශනය විය. මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ප්‍රවේශවල සංකලනයක් වන "මිශ්‍ර ක්‍රමවේදය" භාවිත විය. මෙහි දී දත්ත රැස් කිරීමේ විධික්‍රම ලෙස ප්‍රමාණාත්මක දත්ත ලබා ගැනීම උදෙසා ව්‍යුහගත ප්‍රශ්නාවලි ක්‍රමයත්, ගුණාත්මක දත්ත රැස් කිරීම උදෙසා ටෙලිනාට්‍ය අධ්‍යක්ෂකවරු සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා ක්‍රමයත් උපයෝගී කරගන්නා ලදී. පර්යේෂණයේ න්‍යායාත්මක පදනම සකස් කිරීම සඳහා දේශපාලන සන්නිවේදනය හා දේශපාලන යථාර්ථය අධ්‍යයනයට අදාළ ශාස්ත්‍රීය ග්‍රන්ථ ද්විතීයික මූලාශ්‍ර ලෙස පරිශීලනය කරන ලදී. රැස් කරගත් දත්ත විශ්ලේෂණයේ දී ටෙලිනාට්‍ය පෙළ විමර්ශනය සඳහා අන්තර්ගත විශ්ලේෂණයත්, ප්‍රශ්නාවලි ක්‍රමය ඔස්සේ ලබාගත් දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණයත් භාවිත විය. පර්යේෂණයේ ප්‍රධාන තර්කය වනුයේ, ටෙලිනාට්‍ය යනු හුදු විනෝදාස්වාද මාධ්‍යයක් පමණක් නොව එය පවත්නා දේශපාලන විඥානය අවදි කරන ප්‍රධාන දේශපාලන සන්නිවේදන මෙවලමක් බව යි. එම තර්කය සනාථ කිරීම උදෙසා රෝලන්ඩ් බාත්, ස්ටුවර්ට් හෝල් සහ ජෝර්ජ් ගාර්බනර් වැනි විද්වතුන්ගේ න්‍යායාත්මක ආකෘති උපයෝගී කරගන්නා ලදී. මෙම පර්යේෂණ මඟින් මතු කළ නව දැනුම වනුයේ, ටෙලිනාට්‍යවල අන්තර්ගත සංකේත භාවිත, දෙබස් රචනය, චරිත නිරූපණය ආදී වූ සන්නිවේදන සාධක ප්‍රේක්ෂකයාගේ දේශපාලන විඥානය හැඩගැස්වීම උදෙසා සෘජුවම දායකවන බවයි. නිර්මාණකරුවා කේතනය කරන දේශපාලන සංදේශය, ප්‍රේක්ෂකයා විකේතනය කරගන්නා අයුරු සහ එමඟින් ඔවුන්ගේ දේශපාලනික දැක්ම ප්‍රතිනිර්මාණය වන ආකාරය පිළිබඳ සහසම්බන්ධතාවය මෙහි දී අනාවරණය විය.

මුඛ්‍ය පද: *දේශපාලන යථාර්ථය, ටෙලිනාට්‍ය ආඛ්‍යානය, දේශපාලන සන්නිවේදනය, ප්‍රේක්ෂක සංජානනය*

නායයෑම් අවදානම සහ පූර්ව සූදානම පිළිබඳ අධ්‍යයනයක් (දිගන්න සහ අත්වැල්තොට යන ග්‍රාම නිලධාරී වසම් ඇසුරෙන්)

පත්මසිරි, කේ. ඩී. එස්.
පරිසර කළමණාකරණ අධ්‍යනාංශය,
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
රජරට විශ්වවිද්‍යාලය
dilki0730@gmail.com

සාරසංක්ෂේපය

මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන පරිසර පද්ධති වෙනස්වීම් සහ දේශගුණික විපර්යාස නිසා ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශවල මෙන් ම බෑවුම් සහ උස්බිම් ප්‍රදේශවල ජනතාවට නායයෑම් අවදානම් තත්ත්වයන්ට නිතර මුහුණ දීමට සිදුව ඇත. විශේෂයෙන් ම කළුතර දිස්ත්‍රික්කයේ පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යනු නිරන්තරයෙන් නායයෑම් රතු නිවේදන නිකුත් කරනු ලබන අධි අවදානම් කලාපයකි. මෙම පසුබිම තුළ නායයාම් බහුලව සිදුවන කළුතර දිස්ත්‍රික්කයේ පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දිගන්න සහ අත්වැල්තොට යන ග්‍රාම නිලධාරී වසම් දෙක කේන්ද්‍ර කර ගනිමින් එහි නායයෑම් අවදානම සහ පූර්ව සූදානම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. ඒ අනුව එම ප්‍රදේශවල ජනතාව අතර නායයෑම් අවදානම් තත්ත්වයන් සහ පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ පවතින දැනුවත්භාවය සහ අවබෝධය කෙසේදැයි යන්න අධ්‍යනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව ලෙස ගෙන ඇත. මෙම අධ්‍යනය සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත රැස් කිරීමේ මිශ්‍ර ක්‍රමවේදයක් අනුගමනය කර ඇති අතර, දත්ත එකතු කිරීම සඳහා දිගන්න සහ අත්වැල්තොට යන ග්‍රාම නිලධාරී වසම්වල ප්‍රදේශවාසීන් සහ අදාළ ක්ෂේත්‍ර නිළධාරීන් ඉලක්ක කරගනිමින් ප්‍රශ්නාවලියක් සහ ක්ෂේත්‍ර අධ්‍යනය ඔස්සේ ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වූ ප්‍රධාන සොයාගැනීම්වලට අනුව නිරන්තරයෙන් රතු නිවේදන නිකුත් කෙරෙන ප්‍රදේශයක් වුව ද, ප්‍රදේශවාසීන් අතර නායයෑමකට පූර්වයේ ඇතිවන භූමියේ හදිසි ඉරිතැලීම්, ගිලාබැසීම්, නිවාසවල බිත්ති පුපුරා යාම් වැනි ස්වාභාවික ලක්ෂණයන් සහ ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ සංවිධානය විසින් නිකුත් කරනු ලබන පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳවද, හදිසි ආපදා අවස්ථාවක දී ක්‍රියාත්මක පිළිබඳ දැනුවත්භාවය මද මට්ටමක පැවතීම සහ හදිසි ආපදා අවස්ථාවකදී ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ අවබෝධය පවතින්නේ මද මට්ටමකිනි. තව ද, අවදානම් කලාපවල සිදුවන අනවසර ඉදිකිරීම් සහ ආපදා කළමණාකරණ ආයතන සමග පවතින අන්තර් ආයතනික සම්බන්ධීකරණ දුර්වලතා හේතුවෙන් ජීවිත හා දේපළ ආරක්ෂා කරගැනීමේ යාන්ත්‍රණයට දැඩි බාධාවක් වී ඇති බව හඳුනාගත හැකි විය. සමස්තයක් ලෙස, නායයෑම් අවදානම් කලාපවල පූර්ව සූදානම තවදුරටත් විධිමත් කළ යුතු බව මෙම අධ්‍යයනයෙන් පෙන්වා දෙයි. පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ආපදා කළමණාකරණ වැඩපිළිවෙල යාවත්කාලීන කිරීම ඒ සඳහා ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් ආදිය පිළිබඳ නිසි නීතිමය අධීක්ෂණය යාන්ත්‍රනයක් ක්‍රියාත්මක කිරීම, අන්තර් ආයතනික සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, ආපදා කමිටු ආදිය හරහා පූර්ව ස්වාභාවික ආපදා ලක්ෂණයන් හා පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම, ප්‍රායෝගික වැඩසටහන්, පුහුණු සැසි මඟින් කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේද ශක්තිමත් කිරීම, එම ක්‍රමවේද ජනතාවට වඩාත් සමීප කිරීම මඟින් අනාගත හානි අවම කරගත හැකි බව මෙම අධ්‍යනයෙන් නිගමනය කරයි.

ප්‍රමුඛ පද: *නායයෑම් අවදානම, රතු නිවේදන, පූර්ව සූදානම, ආපදා කළමණාකරණය*

නර්තනයෙහි අන්තර්ගත කලාත්මක ලක්ෂණ සහ ක්‍රීඩා ලක්ෂණ පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

රන්චාමර, ඩී. එල්. අයි. එස්.
සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය
indunilranchamara@gmail.com

සාරසංක්ෂේපය

නර්තනය මානව සමාජයේ අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයේ ප්‍රධාන අංගයක් වන අතර එය සෞන්දර්යාත්මක ප්‍රකාශනයකි. සංස්කෘතික අනන්‍යතාව හා සමාජීය සන්නිවේදනය ප්‍රකාශන කලා මාධ්‍යයක් ලෙස දීර්ඝ ඉතිහාසයක් දරයි. නර්තනයේ මූලික මාධ්‍ය වන ශරීරය (චලනය) ආශ්‍රයෙන් සිදුකරනු ලබන කායික, මානසික, සමාජීය සහ අධ්‍යාත්මික ක්‍රියාවලියකි. ක්‍රීඩාව ද, විශේෂයෙන් සටන් ක්‍රීඩා ද සටන් කලා ලෙස භාවිත කරයි. ප්‍රවේණිගතව නර්තනය සහ ක්‍රීඩාව අංගයන් හි මූලධර්ම ක්‍රමවේද යාවත්කාලීන වෙයි. කාලානුරූපීව ඇතැම් විෂය කරුණු විෂය ක්ෂේත්‍රයෙන් ඉවත්වන අතර ඇතැම් නවාංග විෂය ක්ෂේත්‍රයට එකතු වෙයි. එහෙත් සමකාලීන සමාජයේ නර්තන ක්‍රීඩා (Dance Sport) ශරීරය චලනය මඟින් බණ්ඩනය කිරීමේ නර්තන (Break Dancing) ආදී තරඟකාරී නර්තන ආකෘති ජාත්‍යන්තර ක්‍රීඩා ක්ෂේත්‍රයට ඇතුළත් වීමත් සමඟ නර්තනය ක්‍රීඩාවක් ලෙසද සැලකීම පිළිබඳ ශාස්ත්‍රීය සංවාදයක් ගොඩනැඟී ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ නර්තනය කලාවක් සහ ක්‍රීඩාවක් ලෙස හඳුනාගන්නා සංකල්පීය, සෞන්දර්යාත්මක හා ක්‍රියාකාරී ලක්ෂණ තුලනාත්මකව විශ්ලේෂණය කිරීම සහ ශ්‍රී ලංකා සන්දර්භය තුළ එහි ස්ථානය පැහැදිලි කිරීම යි. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයක් භාවිත කරමින් නර්තන ආචාර්යවරුන්, නර්තන ශිල්පීන්, ක්‍රීඩා විද්‍යාඥයන් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සමඟ අර්ධ - ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පවත්වන අතර සාහිත්‍ය හා ප්‍රතිපත්ති ලේඛන ද විශ්ලේෂණය කරනු ලැබේ. නර්තනයෙහි කලාත්මක ලක්ෂණ සහ ක්‍රීඩාත්මක ලක්ෂණ පිළිබඳව සඳහන් ලිඛිත මූලාශ්‍ර අධ්‍යනයේ දී ලින්ඩ්සේ ගරිනෝ විසින් රචිත – (Is Dance a Sport? A twenty – first century Debate) ලිපියෙහි නර්තනය කලාවක් ද ක්‍රීඩාවක් ද යන්න සරලව විග්‍රහ කළ නොහැකි බව දැක්වෙයි. නර්තන ශිල්පියාගේ තාක්ෂණික දක්ෂතාව, ශාරීරික ශක්තිය, පුහුණුව ක්‍රීඩාව සමඟ සම්බන්ධ බවත්, නර්තනයෙහි නිර්මාණශීලීත්වය, ප්‍රකාශන කලාව සමඟ සම්බන්ධ බව දැක්වෙයි. තවද, ජෙසන් හෝල්ට් විසින් රචිත ක්‍රීඩාව කලාවක්ද? නර්තනය කලාවක්ද? මූලාශ්‍රය සහ පික්කෝ මාර්කියුලා විසින් රචිත (The Intersection of Dance and Sport) මූලාශ්‍ර අධ්‍යනය මෙම පර්යේෂණය සඳහා වැදගත් වනු ඇත. නර්තනය නම් වූ මානව ක්‍රියාවලිය තුළ ක්‍රීඩාවන්හි මූලිකාංග සහ කලාත්මක මූලිකාංග ඇතුළත් උභය ලක්ෂණ සහිත විෂයක් ලෙස ද දැක්විය හැකිය. නමුත් නර්තනය නම් වූ කලාත්මක ක්‍රියාවලියේ අන්තර්ගත සුවපත්භාවය ශ්‍රව්‍ය, දෘශ්‍ය සහ මෙම උභය ලක්ෂණයන් ප්‍රබලව සංවර්ධනය වී ඇත. ශරීරය මූලික මාධ්‍ය වූ මෙම වෘත්තීන් දෙකෙහිම පොදු ලක්ෂණ අන්තර්ගත ය. නමුදු, ක්‍රීඩාවකට සාපේක්ෂව නර්තන කලාවේ රිද්මීය ලක්ෂණ අභිබවා තාලාත්මක ලක්ෂණ ප්‍රබල වේ. උක්ත දත්ත තේමාත්මක සහ තුලනාත්මක විශ්ලේෂණයට ලක් කෙරේ. පර්යේෂණයෙන් අනාවරණය වනු ඇතැයි අපේක්ෂා කරන්නේ නර්තනය සෞන්දර්යාත්මක නිර්මාණශීලීත්වය, සංස්කෘතික උරුමය සහ කලාත්මක ප්‍රකාශනය නියෝජනය කරන අතරම ශාරීරික දක්ෂතාව, තරඟකාරීත්වය, විනය සහ කාර්යසාධන මිනුම් වැනි ක්‍රීඩාමය ලක්ෂණ ද ඇතුළත් බහුවිධ විෂය ක්ෂේත්‍රයක් බවයි. මෙම අධ්‍යයනය අස්පෘශ්‍ය සංස්කෘතික උරුමය සුරැකීම, නර්තන අධ්‍යාපනය, කලා හා ක්‍රීඩා ප්‍රතිපත්ති සංවර්ධනය සහ නර්තනය පිළිබඳ නව ශාස්ත්‍රීය සංවාදයක් ගොඩනැගීම සඳහා දායක වනු ඇත. ශරීර අශ්‍රේය මානව චර්යාවන් උපයෝගීතාවය අනුව නර්තනය ක්‍රීඩාවක් සහ කලාවක් ලෙස භාෂිත කළ හැකි බව පසක් විය. නර්තනයෙහි අන්තර්ගත නිර්මාණශීලීත්වය, සෞන්දර්ය, හැඟීම් ප්‍රකාශනය, අර්ථ නිරූපණය, රංග වින්‍යාසකරණය, සංස්කෘතික නියෝජනය ආදී කලාත්මක ලක්ෂණත්, ශාරීරික ශක්තිය, දරා ගැනීම, වේගය, නම්‍යශීලි බව, තරඟකාරීබව, ආදී උභය ලක්ෂණ සහිත විනයවත් වූ ක්‍රියාවලියක් ලෙස නර්තනය ප්‍රතීයමාන වේ.

මුඛ්‍ය පද: *නර්තනය, අස්පෘශ්‍ය සංස්කෘතික උරුමය, කලාව, ක්‍රීඩාව, තුලනාත්මක අධ්‍යයනය*

A Study on the Effects of Flood Disasters on Livelihoods and Local Economy in Kurunegala District

Rajapaksha, R. M. S. U.
Faculty of Graduate Studies,
Eurasian Campus, Sri Lanka
Sandunir483@gmail.com

Abstract

Flood disasters represent one of the most severe natural hazards affecting Sri Lanka, with the Kurunegala District experiencing acute vulnerability due to frequent and intense rainfall events. This study examined the effects of flood disasters on local livelihoods and economic activities within the Kurunegala District. Utilizing a descriptive research design executed across three systematic stages, primary data were gathered through structured questionnaires and face-to-face interviews with a sample of 120 flood-affected individuals in the district's most vulnerable divisions. Secondary data from government reports and published literature supplemented the primary empirical investigation. Data were processed and analyzed using non-parametric statistical methods alongside descriptive tools, including percentages and graphical representations. The findings revealed widespread socio-economic disruption across both rural and urban areas. Agricultural livelihoods sustained the highest direct losses, characterized by severe crop destruction, soil degradation, and prolonged field inundation, which reduced household incomes by up to 60% during post-flood recovery periods. Small enterprises experienced severe operational disruptions, inventory loss, and localized physical damage, leading to significant liquidity deficits and delayed commercial recovery. Furthermore, residential property damage and infrastructure destruction placed heavy financial burdens on low-income households, increasing dependence on high-interest informal credit. The study concluded that recurrent flooding in the Kurunegala District operates as a primary driver of persistent socio-economic vulnerability, disproportionately affecting agricultural workers and small business owners. To mitigate future losses, disaster management strategies must prioritize the construction of flood-resilient drainage infrastructure, establish micro-insurance schemes for small businesses and farmers, and integrate localized early-warning systems into divisional policy frameworks.

Keywords: *Flood Disasters, Livelihoods, Local Economy, Socio Economic, Kurunegala District*

ශ්‍රී ලාංකේය පහතරට බෙර වාදන කලාව සංරක්ෂණය සහ ජනගත කිරීම උදෙසා නව ස්වර ප්‍රස්තාරකරණ ක්‍රමයක අවශ්‍යතාව

රන්චාමර, ඩී. එල්. අයි. එස්.
සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය
indunilranchamara@gmail.com

සාරසංක්ෂේපය

ශ්‍රී ලාංකේය පහතරට බෙර වාදන කලාව අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයේ වැදගත් අංගයක් වන අතර, එය පරම්පරාවෙන් පරම්පරාවට ප්‍රධාන ගුරු ශිෂ්‍ය සම්ප්‍රදාය ඔස්සේ මොඛිකව සම්ප්‍රේෂණය වී ඇත. එහෙත් සමාජ, අධ්‍යාපනික සහ තාක්ෂණික වෙනස්කම් හේතුවෙන් මෙම සම්ප්‍රදාය විධිමත් ලෙස ලේඛනගත කිරීමේ අවශ්‍යතාව වර්තමානයේ වැඩි අවධානයට ලක්ව ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ පහතරට බෙර වාදන සම්ප්‍රදාය සංරක්ෂණය, ඉගැන්වීම සහ ජාත්‍යන්තර සමාජයට ප්‍රචලිත කිරීම සඳහා ස්වර ප්‍රස්තාරකරණයේ දායකත්වය විමර්ශනය කිරීමයි. ලෝකයේ විෂයක් ලෙස ප්‍රචලිත බොහෝ වාද්‍ය භාණ්ඩ සඳහා විධිමත් ස්වර ප්‍රස්තාරකරණ ක්‍රමයක් පවතී. විශේෂයෙන් ම තාල වාද්‍ය භාණ්ඩ සඳහා ද සුවිශේෂී වූ ස්වර ප්‍රස්තාකරණ ක්‍රම ඇත. නමුත් ශ්‍රී ලාංකේය බෙර වාදන සඳහා විධිමත් ස්වර ප්‍රස්තාරකරණ ක්‍රමයක අවශ්‍යතාවය දැඩිව පවතිනු ඇත. එම රික්තකය සම්පූර්ණ කිරීමේ මූලික පියවරක් ලෙස මෙම පර්යේෂණය දැක්විය හැකිය. ශ්‍රී ලාංකේය බෙර වාදන භාණ්ඩ විශාල ප්‍රමාණයක් පවතින බැවින් සීමාන්විතව පහතරට බෙර වාදනය සුවිශේෂී කොට ගෙන මෙම පර්යේෂණය මෙහෙයවීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයක් භාවිත කරමින් පහතරට බෙර ගුරුවරුන්, ප්‍රවීණ ශිල්පීන් සහ සංගීත අධ්‍යාපනවේදීන් සමඟ අර්ධ - ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පවත්වන අතර, පුහුණු සැසි, ප්‍රසංග සහ පවතින ස්වර ප්‍රස්තාර, සංගීත ලේඛණ හා අදාළ සාහිත්‍ය ද විශ්ලේෂණයට ලක් කෙරේ. බටහිර වාද්‍ය භාණ්ඩයක් වන ඩ්‍රම් කිට් හි (Drum kit) ස්වර ප්‍රස්තාරකරණයේ මූලිකාංග ඇසුරෙන් තාල ලකුණු (Time Signature), බෙර ආඝාත අවධාරණය (Drum Accents), ශිල්පීය දක්ෂතා වන පෙරලීම් (Rolling), සහ මූලික බෙර අක්ෂර වාදනය කිරීමේ ශිල්ප ක්‍රම සටහන් කිරීමට අවශ්‍ය දේශීය අනන්‍යතාවයකින් යුත් සංකේත භාවිතයෙන් නවමු ස්වර ප්‍රස්තාරකරණ ක්‍රමයක් හඳුන්වාදීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වේ. රැස් කරන ලද දත්ත තේමාත්මක විශ්ලේෂණය මඟින් අර්ථකථනය කරනු ලැබේ. පර්යේෂණයෙන් අනාවරණය වනු ඇතැයි අපේක්ෂා කරන්නේ විධිමත් ස්වර ප්‍රස්තාරකරණය මඟින් පහතරට බෙර වාදන රටා නිරවද්‍ය ලෙස ලේඛණගත කිරීම, ඉගෙනීම සහ ඉගැන්වීම පහසු කිරීම, ප්‍රාදේශීය වෙනස්කම් සුරක්ෂිත කිරීම සහ තරුණ පරපුර අතර මෙම සම්ප්‍රදාය ව්‍යාප්ත කිරීම සඳහා සැළකිය යුතු දායකත්වයක් ලබා දෙන බව යි. එමෙන් ම ඩිජිටල් ලේඛනගත කිරීම හා ප්‍රමිගත ස්වර ප්‍රස්තාර පද්ධතියක් සංවර්ධනය කිරීම මඟින් පහතරට බෙර වාදන කලාවේ තිරසාර පැවැත්ම සහ ජාත්‍යන්තර ප්‍රවර්ධනය ශක්තිමත් කළ හැකි බව ද මෙම අධ්‍යනයෙන් අවධාරණය කරණු ඇත. උක්ත ප්‍රමිතිගත ස්වර ප්‍රස්තාර ක්‍රමවේදයකට අනුව පහතරට බෙර වාදන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අනුගතව මාර්ගගත හා විධිමත් අධ්‍යාපන ක්‍රම මඟින් ඉගැන්වීම පහසු වනු ඇත. එමඟින් ජාත්‍යන්තර ප්‍රජාව තුළ ශ්‍රී ලාංකේය බෙර වාදනය ඉගෙනීමේ ආශක්ත බව තීව්‍රර වනු ඇත. පහතරට බෙර වාදනය සඳහා විධිමත් ස්වර ප්‍රස්තාරකරණ ක්‍රමවේදයක් ගොඩනැගීම මඟින් දේශීය අනෙකුත් බෙර වාදන ක්‍රම සඳහා උක්ත ක්‍රමවේදය භාවිත කළ හැකි ය. මෙම පර්යේෂණය අස්පෘශ්‍ය සංස්කෘතික උරුම සංරක්ෂණය, සංගීත අධ්‍යාපනය සහ ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික වාද්‍ය කලාව ලේඛනගත කිරීම සඳහා ප්‍රායෝගික හා ප්‍රතිපත්තිමය දායකත්වයක් සපයනු ඇත.

මුඛ්‍ය පද: *අස්පෘශ්‍ය සංස්කෘතික උරුම, පහතරට බෙර වාදනය, ස්වර ප්‍රස්තාරකරණය, සංරක්ෂණය, සංගීත අධ්‍යාපනය*

Highlights from the
2nd NILE-EURASIAN INTERNATIONAL SYMPOSIUM

NEXS

3rd NILE-EURASIAN INTERNATIONAL SYMPOSIUM 2026

"Sustainable Graduates, Sustainable Nation"



The Nile - Eurasian Symposium brings together a diverse community of scholars, researchers, educators and professionals from around the world to exchange ideas, share knowledge, and explore innovative solutions to global challenges.

NEXS aims to provide a multidisciplinary platform for sharing innovative research findings, promoting academic excellence, and strengthening global partnerships for sustainable development.

ISSN
ISSN 3051-4835
9 773051 483006

Eurasian Campus
No.130A/3,
Horana Rd, Kesbewa

Eurasian Campus
No.264, 100Ft Rd,
Mirijjhawila, Hambanthota

Eurasian International Institute
No.91, SIBCC Head Office
Seelananda Nahimi Mw, Delthara,
Piliyandala

Eurasian International
College and CC House
No.264, 100Ft Rd,
Mirijjhawila, Hambanthota

Eurasian International
College and Pre School,
44, Mihindu Mawatha,
Kesbewa